ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 1996 අංක 2 දරන

## ධීවර සහ ජලජ සම්පත් පනත

[සහතිකය සටහන් කළේ 1996 ජනවාරි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1996 ජනවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 3.00 යි.

තැපැල් ගාස්තුව : රු. 3.10 යි.

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

[සහතිකය සටහන් කළේ 1996 ජනවාරි මස 11 වන දින.]

**ලේ. ඛ.—ඛ. 27/89**

**ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ (212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනත, (213 වන අධිකාරය වූ) හක් බෙලි පනත, (214 වන අධිකාරය වූ) මුතු බෙල්ලන් පිළිබඳ ආඥාපනත සහ (215 වන අධිකාරය වූ) හල් මසුන් පිළිබඳ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය**

1. මේ පනත 1996 අංක 02 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### පරිපාලනය

**අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධාරයන් පත් කිරීම.**

2. (1) පහත දැක්වෙන නිලධරයන්, එනම්—

(අ) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා ලෙස හෝ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා හෝ නමින් හෝ නිලයෙන්, යම් තැනැත්තකු ;

(ආ) ධීවර සහ ජලජ සම්පත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් ලෙස ධීවර සහ ජලජ සම්පත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් වශයෙන් ක්‍රියා කිරීමට හෝ නමින් හෝ නිලයෙන්, එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් ; සහ

(ඇ) මේ පනතේ කාර්ය සඳහා කලින් කල අවශ්‍ය වන වෙනත් නිලධරයන්

පත් කරනු ලැබිය යුතු ය.

(2) මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන, ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) ධීවර සහ ජලජ සම්පත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ධීවර සහ ජලජ සම්පත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් ක්‍රියා කිරීමට (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, මේ පනත මගින් හෝ එය යටතේ අධ්‍යක්ෂවරයා වෙත පිරිනමනු ලබන බලතල සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ අධ්‍යක්ෂවරයාගේ පාලනයට යටත්ව, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන සියලුම නිලධරයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව, රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන (ධීවර පරීක්ෂක නිලයට පහළ නොවූ නිලයක් දරන) සියලු නිලධරයන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා, සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව පිහිටුවීම.

6. (1) මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව පිහිටුවනු ලැබිය යුතු අතර එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) සභාවේ සභාපතිවරයා විය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ සහ ධීවර සහ ජලජ සම්පත් විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ආ) අධ්‍යක්ෂවරයා ;

(ඇ) එක් එක් පළාතේ ධීවර අධ්‍යක්ෂවරයා ;

(ඈ) ජාතික ධීවර අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ඉ) සභාවේ ලේකම්වරයා විය යුතු, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂවරයා ;

(ඊ) ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ සභාපතිවරයා ;

(උ) රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ධීවර සංස්ථාවේ සභාපතිවරයා ;

(ඌ) රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා ධීවර වරාය සංස්ථාවේ සභාපතිවරයා ;

(එ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා ;

(ඒ) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා ;

(ඔ) සීමාසහිත ශ්‍රී ලංකා ජාතික ධීවර සමූපකාර සමිති මහ සංගමයේ සභාපතිවරයා ;

(ඕ) සීමාසහිත ශ්‍රී ලංකා ජාතික ධීවර සමූපකාර සමිති මහ සංගමය නම් කරන ධීවරයින් දෙදෙනෙක් ;

(ක) ධීවර නිෂ්පාදන අපනයනකරුවන්ගේ සංගමයේ සභාපතිවරයා ;

(ග) ශ්‍රී ලංකා සජීවී විසිතුරු මත්ස්‍ය අපනයන සංගමයේ සභාපතිවරයා ;

(ච) ධීවර කාන්තාවන්ගේ නියෝජිතයින් දෙදෙනෙක් ;

(ජ) ධීවර කර්මාන්තයට හෝ වෙනත් විද්‍යාත්මක විෂයයන්ට සම්බන්ධ කාරණා පිළිබඳ විශේෂ දැනුමක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් සාමාජිකයන් සය දෙනෙක්.

(2) නිරීක්ෂකයන් වශයෙන් සහභාගීවීම සඳහා සුදුසු යයි සභාව අදහස් කරන වෙනත් තැනැත්තන්ට සභාවේ රැස්වීම්වලට සහභාගී වන ලෙස සභාව විසින් ආරාධනය කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටී නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වේ නම්

ඒ තැනැත්තා සභාවේ පත් කළ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ දිගටම සිටීමට නුසුදුස්සකු වන්නේ ය.

(4) සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම තමා කලින් ධුරය හිස් කළහොත් හෝ අමාත්‍යවරයා විසින් (5) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, අවුරුදු තුනක කාලයක් තම ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) සභාවේ යම් පත් කළ සාමාජිකයකු, හේතු දැක්වීමක් නොමැති ව, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(6) යම් පත් කළ සාමාජිකයකු තම ධුරය හිස් කළ හෝ (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී, ඔහුගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(7) රෝගීව සිටීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(8) සභාවේ රැස්වීම්වලට සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා වූ රීති, මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් සාදනු ලැබිය යුතු ය.

(9) සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුතු කිරීමක් හෝ අවලංගු නොවන්නේ ය.

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාවේ කර්තව්‍ය සහ බලතල— සභාවේ කර්තව්‍ය සහ බලතල.

(අ) ශ්‍රී ලංකා ජලතීරයේ ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීමට, විධිමත් කිරීමට, සංරක්ෂණය කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) උපදෙස් ලබාගැනීම පිණිස අමාත්‍යවරයා විසින් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් කරුණු සලකා බැලීම සහ ඒවා සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම ; සහ

(ඇ) මේ පනත ක්‍රියාත්මක කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් සභාව වෙත යොමු කරනු ලබන සියලු කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම

විය යුතු ය.

ධීවර කළමනාකරණය සහ සංවර්ධනය සඳහා සැලැස්ම.

**5.** ශ්‍රී ලංකාවේ ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ සැලැස්මක් සභාව විමසා කලින් කල පිළියෙල කිරීමට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

## II වන කොටස

## ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම

ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම.

**6.** (1) අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ සහ එහි අඩංගු නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව මිස, ශ්‍රී ලංකා ජලතීරයේ යම් නියමිත ධීවර මෙහෙයුමක යෙදීම හෝ වෙනත් තැනැත්තකු එවැනි මෙහෙයුමක යෙදීමට සැලැස්වීම හෝ කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) බලපත්‍ර දීමේ බලය, මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ බලපත්‍ර දීමේ නිලධරයකු වෙත, අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, මේ කාර්යය සඳහා, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් බලපත්‍ර දීමේ නිලධරයකු හෝ නිලධරයන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැකි ය.

(3) ධීවර පරීක්ෂකවරයකුගේ නිලයට පහළ නිලයක් දරන කිසිදු නිලධරයකු බලපත්‍ර දීමේ නිලධරයකු වශයෙන් පත් නොකරනු ලැබිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම.

**7.** (1) 6 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා කරන ලබන සෑම ඉල්ලීමක් ම එම ධීවර මෙහෙයුම් කර ගෙන යාමට අපේක්ෂා කරන පරිපාලන දිස්ත්‍රික්කයේ බලපත්‍ර දීමේ නිලධරයා වෙත, නියමිත ආකෘති පත්‍රය මගින්, නියමිත ගාස්තුව ද සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) යෝජිත ධීවර මෙහෙයුම් කරගෙන යාමට අපේක්ෂිත පරිපාලන දිස්ත්‍රික්කය සඳහා බලපත්‍ර දීමේ නිලධරයකු පත් කර නොමැති නම්, ඒ ඉල්ලීම අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා විසින්, බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ තමා විසින් වාර්තා කරනු ලැබිය යුතු හේතු මත බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කළ යුතු ය.

8. මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලබන සෑම බලපත්‍රයක්ම— බලපත්‍රයේ ආකෘතිය සහ වලංගු කාලය.

(අ) නියමිත ආකෘතියට අනුකූල විය යුතු ය;

(ආ) කලින් අවලංගු නොකරනු ලැබුවහොත්, බලපත්‍රය ප්‍රදානය කරන දින සිට එක් වර්ෂයක කාලයකට වලංගු විය යුතු ය;

(ඇ) බලපත්‍රය ප්‍රදානය කරනු ලබන ධීවර මෙහෙයුම් සම්බන්ධයෙන් නියම කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

9. (1) මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක කාලය ඉකුත්වීමට පෙර දින තිහකට නොඅඩු කාලයක් තුළ දී අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ බලපත්‍ර දීමේ නිලධරයා වෙත ඉල්ලුම් කිරීමෙන් ඒ බලපත්‍රය අලුත් කරගත හැකි විය යුතු ය. බලපත්‍ර අලුත් කිරීම.

(2) බලපත්‍රයෙන් බලය දෙන ලද ධීවර මෙහෙයුම් කරගෙන යන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා බලපත්‍ර දීමේ නිලධරයකු පත් කර නොමැති නම්, බලපත්‍රය අලුත් කිරීම සඳහා වූ ඉල්ලීම අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) අවශ්‍යතාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ—

(අ) ඒ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි බලපත්‍රලාභී විසින් පිළිපදිනු ලැබ ඇති බවට;

(ආ) බලපත්‍රය අලුත් කිරීම හේතුකොට ගෙන මත්ස්‍ය හෝ අනෙකුත් ජලජ සම්පත්වල පැවැත්මට හානියක් නොවන බවට; සහ

(ඇ) බලපත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව බලපත්‍රලාභී විසින් ගෙවා ඇති බවට

සෑහීමට පත් වේ නම්, ඔහු විසින් ඒ බලපත්‍රය අලුත් කළ යුතු ය.

10. අවශ්‍යතාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍ර දීමේ නිලධරයා විසින් මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක බලපත්‍රලාභී— බලපත්‍රය අවලංගු කිරීම.

(අ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝග හෝ බලපත්‍රයේ අඩංගු යම් නියමයන් හෝ කොන්දේසි කඩ කර ඇති බවට; හෝ

(ආ) මේ පනත යටතේ වූ යම් වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට,

ඒ අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍රදීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, ඔහු විසින් ඒ බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

9—ශ 037866 (95/07)

[illegible]

**11.** (1) අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍ර දීමේ නිලධරයා විසින් බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලද, නැතහොත් බලපත්‍රයක් අවලංගු කරන ලද අවස්ථාවක දී තමාගේ එම තීරණය සහ ඊට හේතු අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභී වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් දැනුම් දිය යුතු ය.

(2) එවැනි යම් තීරණයක් පිළිබඳ නිවේදනය අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභී වෙත ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානයට හෝ සාමාන්‍ය පදිංචි ස්ථානයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද දින සිට ගණන් බලනු ලබන දින තිහක් ගතවීමෙන් පසු ඒ තීරණය ඔහු වෙත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

[illegible]

**12.** (1) 11 වන වගන්තිය යටතේ තමාට දැනුම් දෙනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත්, අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභී විසින්, ඒ තීරණයට විරුද්ධව ලිඛිත අභියාචනයක් තමා වෙත එම තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ලේකම්වරයා විසින්,—

(අ) ඒ අභියාචනයට ඉඩ දෙමින් බලපත්‍රය ප්‍රදානය කරන ලෙස, අලුත් කරන ලෙස හෝ අවලංගු කිරීම ප්‍රත්‍යාදිෂ්ට කරන ලෙස, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයාට හෝ බලපත්‍ර දීමේ නිලධරයාට විධාන කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය.

(3) ලේකම්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක්, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍ර දීමේ නිලධරයා විසින් පිළිපැදිය යුතු ය.

(4) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලීමක් මේ පනතේ ඉහත සඳහන් විධිවිධාන කිසිවක් යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ඉල්ලීම සමග ඉදිරිපත් කරන ලද ගාස්තුව, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍ර දීමේ නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභීට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක වන්නේ ය.

13. (1) මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද කිසිම බලපත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි, එය ප්‍රදානය කරන අධ්‍යක්ෂවරයා හෝ බලපත්‍ර දීමේ නිලධරයා විසින් ඒ බලපත්‍රයේ පිටසන් කරනු ලැබිය යුතු අනුමතිය ඇතිව මිස, කිසිවකුට පවරනු නොලැබිය හැකි ය. බලපත්‍ර පැවරීම.

(2) තම බලපත්‍රය 10 වන වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ කිසිම තැනැත්තකුට බලපත්‍රයක් තම නමට පවරා ගැනීමේ හිමිකම නැත්තේ ය.

13අ. යම් පළාතක පදිංචි තැනැත්තන්ට අයිති බෝට්ටු සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද, අලුත් කරන ලද, අවලංගු කරන ලද හෝ පවරන ලද, සියලු බලපත්‍ර පිළිබඳ විස්තර, අධ්‍යක්ෂවරයා විසින් එම පළාතේ අමාත්‍ය මණ්ඩලයේ ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට සැපයිය යුතු ය. බලපත්‍ර විස්තර සැපයීම.

14. 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සඳහා භාවිතා කරනු ලබන යම් විදේශීය ධීවර බෝට්ටුවකට මේ කොටසේ විධිවිධාන අදාළ නොවන්නේ ය. මේ කොටසේ විධිවිධාන විදේශීය ධීවර බෝට්ටුවලට අදාළ නොවීම.

## III වන කොටස

## දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම

15. (1) දේශීය ධීවර බෝට්ටු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂවරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීම.

(2) ශ්‍රී ලංකා ජලතීරයේ මසුන් ඇල්ලීම සඳහා යොදා ගනු ලබන දේශීය ධීවර බෝට්ටුවක සෑම අයිතිකරුවකු විසින්, ඒ බෝට්ටුව සහ එහි අයිතිකරුගේ නම ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

(3) ලියාපදිංචි කිරීම සඳහා (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතිය අනුව කළ යුතු අතර නියමිත ගාස්තුව ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා වෙත ලැබුණ විට ඉල්ලුම්කරු ඒ ඉල්ලීමට අදාළ බෝට්ටුවේ අයිතිකරු බව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා විසින් සඳහන් කරනු ලබන වෙනත් ලේඛන හෝ තොරතුරු ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා විසින් එම ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(5) ඒ ඉල්ලීම සහ (4) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ලේඛන සහ තොරතුරු කිසිවක් වේ නම් ඒවාද සලකා බැලීමෙන් පසු ඒ ඉල්ලීමට අදාළ දේශීය ධීවර බෝට්ටුව සහ ඒ අයිතිකරුගේ නම ලියාපදිංචි කළ යුතු ය. නැතහොත්, අධ්‍යක්ෂවරයා විසින් සටහන් කළ යුතු හේතු මත, ඒ දේශීය ධීවර බෝට්ටුව සහ එහි අයිතිකරුගේ නම ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(6) දේශීය ධීවර බෝට්ටු පිළිබඳ ලේඛනයෙහි නම ඇතුළත්ව ඇති තැනැත්තා, මේ පනතේ කාර්ය සඳහා ඒ බෝට්ටුවේ අයිතිකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) එක් එක් වර්ෂය අවසානයේ දී අධ්‍යක්ෂවරයා විසින් එක් එක් පළාතේ පදිංචි තැනැත්තන්ට අයිති නියමිත දේශීය ධීවර බෝට්ටු වර්ග ලියාපදිංචි කිරීම සඳහා එම වර්ෂය තුළ දී ලැබුණු ගාස්තු වලින් නියමිත ප්‍රතිශතයක් ඒ පළාතේ පළාත් අරමුදලට ගෙවිය යුතු ය.

(8) එක් එක් පළාතේ පදිංචි තැනැත්තන්ට අයිති බෝට්ටු මේ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර, අධ්‍යක්ෂවරයා විසින් එම පළාතේ අමාත්‍ය මණ්ඩලයේ ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට සැපයිය යුතු ය.

හිමිකමේ හෝ ලේඛනයේ සටහන් වල වෙනසක් වූ විට ඒ බව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු බව.

16. (1) ලියාපදිංචි කළ දේශීය ධීවර බෝට්ටුවක හිමිකම වෙනස් වූ යම් අවස්ථාවක දී ම ඒ බෝට්ටුවේ අලුත් අයිතිකරු හෝ එහි සන්තකය දරන්නා විසින්, එකී වෙනස සිදු වී දින තිහක් තුළ දී ඒ බව අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කළ යුතු අතර, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, අධ්‍යක්ෂවරයා විසින්, ඒ බෝට්ටුවේ අලුත් අයිතිකරුගේ නම දේශීය ධීවර බෝට්ටු පිළිබඳ ලේඛනයෙහි ලියා පදිංචි කළ යුතු ය.

(2) ලියාපදිංචි කළ දේශීය ධීවර බෝට්ටුවක් නැතිවී ගිය හෝ නැති වූ හෝ අවස්ථාවක දී, ඒ නැතිවීම යාම හෝ නැතිවීම සිදුවී දින හැටක් තුළ දී, ඒ බෝට්ටුවේ අයිතිකරු හෝ එහි සන්තකය දරු තැනැත්තා විසින් ඒ බව අධ්‍යක්ෂවරයා වෙත වාර්තා කළ යුතු ය.

(3) දේශීය ධීවර බෝට්ටුවක හිමිකම පිළිබඳ යම් වෙනස්වීමක් මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවලින් නියම කර ඇති පරිදි දින තිහක් තුළ දී වාර්තා කරන නොලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ බෝට්ටුවේ අලුත් අයිතිකරු හෝ එහි සන්තකය දරන්නා, මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

උකස් සාධන පත්‍ර ලියාපදිංචි කිරීම.

17. (1) දේශීය ධීවර බෝට්ටුවක් උකසකට යටත් කරන (මෙහි මින් මතු "උකස් සාධන පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම සාධන පත්‍රයක්ම අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් උකස් සාධන පත්‍රයක්, එය ඉදිරිපත් කරනු ලබන අනුපිළිවෙළට, අධ්‍යක්ෂවරයා විසින් දේශීය ධීවර බෝට්ටු ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

උකස් සාධන පත්‍ර පිළිබඳ ප්‍රමුඛතාව.

18. එකම දේශීය ධීවර බෝට්ටුව සම්බන්ධයෙන් එකකට වැඩි උකස් සාධන පත්‍ර සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇති අවස්ථාවක ඒ සාධන පත්‍ර, ලියා අත්සන් කරන ලද දිනය අනුව නොව, ඒවා ලියාපදිංචි කරන ලද දිනය අනුව එක් සාධන පත්‍රයක් වෙනත් සාධන පත්‍රයක් අභිභවා ප්‍රමුඛතාව ලැබීමේ හිමිකම ලැබිය යුතු ය:

එසේ වුවද, යම් උකස් සාධන පත්‍රයක් පූර්වයෙන් ලියාපදිංචි කරවා ගැනීමෙහි ලා වංචාවක් හෝ වංක සහයෝගයක් සිදු කර ඇත් නම්, ඒ උකස් සාධන පත්‍රය යටතේ හිමිකම් පාන තැනැත්තාගේ ප්‍රමුඛතාව ඉන් අහෝසි වන්නේ ය.

19. වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, දේශීය ධීවර බෝට්ටුවක පිළිබඳ උකස සාධන පත්‍රයක් 17 වන වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති අවස්ථාවක දී, උකස්කරු විසින් හෝ ඔහුට එරෙහිව හෝ ඒ දේශීය ධීවර බෝට්ටුව උකස්කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම මගින්, උකස බලපවත්නා තාක්, ඒ දේශීය ධීවර බෝට්ටුවේ උකස අහෝසි නොවන අතර, එය අහෝසි වූ ලෙස සලකනු නොලැබිය යුතු ය. තවද, ඒ දේශීය ධීවර බෝට්ටුව, පැවරුම් ලැබී හෝ ඒ බැහැර කරනු ලැබූ වෙනත් තැනැත්තා හෝ [illegible] ඒ උකසට යටත්ව තිබිය යුතු ය. කාර්ය පරිශීලනයන් නිසා හිමිකම් ඇදිය හැර සිදුකළ ද දේශීය ධීවර බෝට්ටුවක ලියාපදිංචි කළ උකසක් බලපැවැත්විය යුතු බව.

20. දේශීය ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කළ උකසක් නිදහස් කරනු ලැබූ අවස්ථාවක දී ඒ උකස නිදහස් කළ බවට වූ සහතිකය උකස් සාධන පත්‍රයේ සටහන් කොට, යථා පරිදි අත්සන් කොට සහ සහතික කොට ඒ සාධන පත්‍රය ද, ලැබුණු මුදල වෙනුවෙන් උකස්ලාභී විසින් නිකුත් කරන ලද ලදුපත ද, අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ උකස නිදහස් කර ඇති බවට සටහනක් අධ්‍යක්ෂවරයා විසින් දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය. උකස් සම්පූර්ණ නිදහස් කිරීම.

21. දේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් වූ යම් උකසක් ලියාපදිංචි කරන ලද දිනයෙන් පසු ඒ උකස්කරු විසින් යම් වස්තු භංගත්ව ක්‍රියාවක් කරනු ලබන අවස්ථාවක ඒ ධීවර බෝට්ටුව උකස්කරුගේ වස්තු භංගත්වය ආරම්භ වන අවස්ථාවේදී ඔහුගේ සන්තකයෙහි ඔහුගේ අණට යටත්ව හෝ ඔහු විසින් බැහැර කරනු ලැබීමට යටත් ව තිබුණේ වුවද, නැතහොත් ඔහු එහි ප්‍රකට අයිතිකරු සිටියේ වුවද ඒ වස්තු භංගත්ව ක්‍රියාව ඒ උකස කෙරෙහි බල නොපෑ යුතු අතර, වස්තු භංගත්වයට පත් වූ තැනැත්තාගේ අනෙකුත් ණය හිමියන්ගේ හෝ ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ යම් භාරකරුවකුගේ නැතහොත් පැවරුම් ලාභියකුගේ ඒ පිළිබඳ අයිතිවාසිකමක්, හිමිකම්පෑමක් හෝ සම්බන්ධතාවක් අභිබවා, එම උකසට ප්‍රමුඛතාව ලැබිය යුතු ය. වස්තු භංගත්වය උකසක් කෙරෙහි බල නොපෑම.

22. (1) දේශීය ධීවර බෝට්ටුවක ලියාපදිංචි කළ උකසක් යම් තැනැත්තකුට පවරනු ලැබිය හැකි අතර, ඒ පැවරුම් කරන්නා වූ (මෙහි මින් මතු "පැවරීමේ සාධන පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාධන පත්‍රය නියමිත ආකෘතියට අනුකූල විය යුතු ය. සෑම පැවරීමේ සාධන පත්‍රයක් ම ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. උකස් පැවරීම සහ ලියාපදිංචි කිරීම.

(2) උකසක් පිළිබඳ සෑම පැවරීමේ සාධන පත්‍රයක්ම අධ්‍යක්ෂවරයා විසින් දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) එසේ පැවරීම දේශීය ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි යථා පරිදි ලියාපදිංචි කර තිබේ නම්, පැවරුම්කරු විසින් දරන ලද ප්‍රමුඛතාව ම ඒ උකස පවරනු ලැබූ තැනැත්තා විසින් දරනු ලැබිය යුතු ය.

**වස්තු භංගත්වය වැනි අවස්ථාවක දී උකසක සම්බන්ධතාව ප්‍රේෂණය වීම.**

**23.** (1) දේශීය ධීවර බෝට්ටුවක උකසක සම්බන්ධතාව, 22 වන වගන්තිය යටතේ කරනු ලැබූ පැවරීමක් මගින් නොව, වස්තු භංගත්වය නිසා හෝ මරණය නිසා හෝ වෙනත් යම් නීත්‍යනුකූල ආකාරයකින් හෝ ප්‍රේෂණය වන අවස්ථාවක ඒ සම්බන්ධතාව ලබන තැනැත්තා විසින් —

(අ) තම නම, ලිපිනය සහ ඒ උකසේ සම්බන්ධතාව තමාට ප්‍රේෂණය වූයේ කවර ආකාරයකින් ද යන්න සඳහන් ප්‍රකාශයක් අධ්‍යක්ෂවරයාට කරනු ලැබිය යුතු ය; තවද

(ආ) ඒ දේශීය ධීවර බෝට්ටුවේ උකසේ සම්බන්ධතාව ප්‍රේෂණය වීම පිළිබඳ සාක්ෂි, අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන පරිදි, ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශය ලැබීම මත සහ එහි සඳහන් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබීම මත අධ්‍යක්ෂවරයා විසින් ඒ ධීවර බෝට්ටුවේ උකස් හිමියා වශයෙන්, එකී සම්බන්ධතාව ලැබ සිටින තැනැත්තාගේ නම සහ ලිපිනය ඒ උකස ලියාපදිංචි කර ඇති දේශීය ධීවර බෝට්ටු ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.

(3) උකසක සම්බන්ධතාව, 22 වන වගන්තිය යටතේ වූ පැවරීමක් මගින් නොව, වස්තු භංගත්වය නිසා හෝ මරණය නිසා හෝ වෙනත් යම් නීත්‍යනුකූල ආකාරයකින් හෝ තමාට ප්‍රේෂණය වී ඇත්තා වූ තැනැත්තා විසින්, ඒ උකස් ලාභියා දැරූ ප්‍රමුඛතාව ම දැරිය යුතු ය.

**සෝදිසි කිරීම සහ පිටපත් ගැනීම.**

**24.** මේ පනත යටතේ පවත්වාගෙන යනු ලබන සියලුම ලේඛන සහ ලියවිලි ඒ පිළිබඳ සම්බන්ධතාවක් ඇතැයි හිමිකම් කියන යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ ලියවිල්ල කිරීමට යථා පරිදි බලය දෙන ලද ඔහුගේ නියෝජිතයකු විසින් සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම කළ හැකි අතර, නියමිත ගාස්තුව ගෙවීමෙන්, එවැනි යම් ලේඛනයක හෝ ලියවිල්ලක සහතික කළ පිටපත් හෝ උධෘත අධ්‍යක්ෂවරයාගෙන් ලබා ගත හැකි ය.

**සාක්ෂි.**

**25.** මේ කොටස ප්‍රකාර පවත්වා ගෙන යනු ලබන යම් ලේඛනයක හෝ ලියවිල්ලක සත්‍ය පිටපතක් හෝ උධෘතයක් බවට අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ සහතික කරන ලද්දක් යයි සලකනු ලබන පිටපතක් හෝ උධෘතයක්, අධ්‍යක්ෂවරයාගේ අත්සන හෝ ඔහුගේ පත්වීම ඔප්පු කිරීමෙන් තොරව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර සියලුම සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී, සියලු කාර්ය සඳහා, ඒ ලේඛනයේ හෝ ලියවිල්ලේ අඩංගු කරුණු සම්බන්ධයෙන්, මූල් බැල්මේ සාක්ෂි විය යුතු ය.

**ඇතැම් ලිඛිත නීති අදාළ නොවිය යුතු බව.**

**26.** චංචල දේපල පිළිබඳ උකසක් ඇති කරන යම් සාධන පත්‍රයක් මේ පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කිරීමට නියම කරන්නා වූ යම් ලිඛිත නීතියක විධිවිධාන මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද උකස් සාධන පත්‍රයකට අදාළ නොවිය යුතු ය.

## IV වන කොටස

### මසුන් සහ වෙනත් ජලජ සම්පත් ආරක්ෂා කිරීම

27. (1) කිසිදු තැනැත්තකු විසින්—

විෂ හෝ පුපුරණ ද්‍රව්‍ය භාවිතය හෝ සන්තකයේ තබා ගැනීම තහනම් කිරීම

(අ) මත්ස්‍ය හෝ වෙනත් ජලජ සම්පත්වලට විෂ යෙදීමේ, මසුන් හෝ වෙනත් ජලජ සම්පත් මරණයට පත් කිරීමේ, විසංඥ කිරීමේ හෝ දුබල කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා ජලතීරය තුළ දී යම් විෂ සහිත, පුපුරණ හෝ විසංඥතාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් හිංසක හෝ අනතුරුකාරී දෙයක් හෝ ද්‍රව්‍යයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම නොකළ යුතු ය ;

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් කාර්යයක් සඳහා විෂ සහිත, පුපුරණ හෝ විසංඥතාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ හිංසක හෝ අනතුරුකාරී වෙනත් යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් භාවිත කිරීමේ චේතනාව පෙන්නුම් කෙරෙන පරිවේෂණ යටතේ එවැනි යම් විෂ සහිත, පුපුරණ හෝ විසංඥතාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ හිංසක හෝ අනතුරුකාරී වෙනත් යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් රැගෙන යාම හෝ තම සන්තකයේ තබා ගැනීම, නොකළ යුතු ය.

(2) යම් මත්ස්‍යයකු හෝ වෙනත් ජලජ සම්පතක් මෙන ඇත්තේ විෂ සහිත පුපුරණ හෝ විසංඥතාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ හිංසක හෝ අනතුරුකාරී වෙනත් යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් භාවිත කොට බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු තිබිය දී එවැනි යම් මත්ස්‍යයකු හෝ වෙනත් යම් ජලජ සම්පතක් ගොඩ බෑමීම, විකිණීම, මිලට ගැනීම, භාර ගැනීම, තම සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(3) විෂ සහිත, පුපුරණ හෝ විසංඥතාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ හිංසක හෝ අනතුරුකාරී වෙනත් යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් ශ්‍රී ලංකා ජලතීරයේ තැබීම, තැන්පත් කිරීම, දැමීම හෝ පිට වීමට සැලැස්වීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

28. තහනම් කරනු ලැබූ ධීවර ආම්පන්න කිසිවක් ශ්‍රී ලංකා ජලතීරයේ කවර වුවද ප්‍රදේශයක භාවිත කිරීම හෝ තම සන්තකයේ තබා ගැනීම හෝ යම් දේශීය ධීවර බෝට්ටුවක් තුළ තබා ගැනීම හෝ තහනම් කරන ලද මසුන් ඇල්ලීමේ ක්‍රමයක් උපයෝගී කර ගැනීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

තහනම් කරන ලද ධීවර ආම්පන්න සහ මසුන් ඇල්ලීමේ ක්‍රම.

තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ සන්තකයේ තබා ගැනීම.

**29.** නියමිත පරිදි වූ තහනම් කරනු ලැබූ මත්ස්‍ය විශේෂ හෝ වෙනත් ජලජ සම්පත් ඇල්ලීම, ගොඩ ඇඹීම, ප්‍රවාහනය කිරීම, විකිණීම, මිලට ගැනීම, භාර ගැනීම හෝ තම සන්තකයේ තබා ගැනීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

මසුන් අපනයනය සහ ආනයනය තහනම් කිරීම හෝ සීමිත කිරීම.

**30.** (1) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන, යම් මත්ස්‍ය විශේෂයක සජීවි මසුන් හෝ මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටවී හෝ එවැනි මත්ස්‍ය සතුන්ගෙන්, උන්ගේ බිත්තරවලින්, අණ්ඩපාතවලින් හෝ පැටවුන්ගෙන් පිළියෙල කරනු ලබන යම් නිෂ්පාදනයක් ඇතුළුව එවැනි යම් මත්ස්‍ය විශේෂයක් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, අමාත්‍යවරයා විසින් වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයකට තහනම් කිරීම හෝ සීමිත කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය, රේගු ආඥාපනතේ කොටසක් වූ පරිද්දෙන් බලපැවැත්විය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

ධීවර කළමනාකරණ ප්‍රදේශ

**31.** (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට යාබද ගොඩබිම හෝ ඒ ජල තීරය සහ ගොඩබිම යන දෙකටම අයත් නියමිත ප්‍රදේශ, මේ පනතේ කාර්ය සඳහා ධීවර කළමනාකරණ ප්‍රදේශ වශයෙන් නම් කරනු ලැබිය හැකි ය;

(ආ) කවර වුවද ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහා 32 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ධීවර කමිටුව ඒ ප්‍රදේශයේ ධීවර කළමනාකරණ අධිකාරිය ලෙස නම් කරනු ලැබිය හැකිය ; තවද

(ඇ) යම් ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහා ධීවර කමිටු දෙකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටවා ඇති අවස්ථාවක දී ඒ එක් එක් කමිටුවෙන් සමානව තෝරා ගනු ලබන තැනැත්තන්ගෙන් දොළොස් දෙනකට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වූ ධීවර කළමනාකරණ අධිකාරියක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයන් මගින් නම් කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ධීවර කළමනාකරණ අධිකාරියක් විසින්—

(අ) ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශයේ ධීවර මෙහෙයුම් පවත්වාගෙන යාම සහ විවිධ වර්ගවල ධීවර ආම්පන්න භාවිත කිරීම ; සහ

(ආ) ඒ ධීවර කළමනාකරණ ප්‍රදේශය තුළ මසුන් ඇල්ලීමේ සංවෘත වාර හෝ යම් නිශ්චිත මත්ස්‍ය විශේෂයක් ඇල්ලීමේ සංවෘත වාර ඇති කිරීම ; සහ

(ඇ) මසුන් ඇල්ලීම කළ යුතු කාලවේලා

සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම කළ හැකි ය.

ධීවර කමිටු

32. (1) එක් එක් ධීවර කළමනාකරන ප්‍රදේශයෙහි හෝ ඉන් යම් කොටසක පදිංචිව සිටින නැතහොත් එහි මසුන් ඇල්ලීමේ නිරතව සිටින ලියාපදිංචි වූ ධීවරයන් විසින් හෝ සංක්‍රමණික ධීවරයන් විසින් හෝ ධීවර කමිටුවක් පිහිටුවා ගනු ලැබිය හැකි ය.

(2) ධීවර කමිටුවක කටයුතුවලට පහත දැක්වෙන කටයුතු ඇතුළත් වේ :—

(අ) ඒ කමිටුවේ ප්‍රදේශය සඳහා ධීවර වැඩසටහනක් සකස් කිරීම සහ ඒ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ;

(ආ) ධීවර මෙහෙයුම්වලදී පාවිච්චි කිරීම සඳහා බෝට්ටු, ආම්පන්න සහ උපකරණ ලබා ගැනීමට ස්වකීය සාමාජිකයන්ට උප කාර කිරීම ;

(ඇ) ඒ ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවීම අරභයා සමාජ, පොදු කාර්ය සාධන සහ සුභ සාධන කටයුතු කරගෙන යාම ; සහ

(ඈ) ඒ ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගේ යහපත පිණිස වන්නේ යැයි අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් කටයුතු වල යෙදීම.

(3) යම් ධීවර කමිටුවක් විසින් ඉල්ලා සිටි විටක, අධ්‍යක්ෂවරයා විසින් ඒ ධීවර කමිටුව ලියාපදිංචි කරනු ලැබිය හැකි අතර, ඒ ලියාපදිංචි කිරීම පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ යම් ධීවර කමිටුවක් ලියාපදිංචි කරන ලද දින සිට සහ ඉන් පසු, ඒ ධීවර කමිටුව අවිච්ඡින්න පැවැත්මක් ඇත්තා වූ ද, පොදු මුද්‍රාවක් තබා ගත හැක්කා වූ ද, එහි ලියාපදිංචි කරන ලද නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැක්කා වූ ද සංස්ථාවක් වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ධීවර කමිටුවක නිලධරයන් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ද ඒ කමිටුවේ බලතල සම්බන්ධයෙන් ද ඒ කමිටුවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද ඒ කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ගිණුම් සම්බන්ධයෙන් සහ අධ්‍යක්ෂවරයා විසින්ම හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් එකී ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ද නියෝග සාදනු ලැබිය හැකි ය.

(6) යම් ධීවර කමිටුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් සුදුසු යයි සලකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, ඒ ධීවර

කමිටුව අක්‍රියව පවතින බවට හෝ ස්වකීය සාමාජිකයන්ගේ සුභසිද්ධිය ගෙන දෙන ආකාරයට කටයුතු කිරීම පැහැර හැර ඇති බවට හෝ අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වූ විටක ඒ ධීවර කමිටුවේ ලියාපදිංචිය අධ්‍යක්ෂවරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂවරයා විසින් යම් ධීවර කමිටුවක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී ඒ ධීවර කමිටුවේ ඈවරකරු වශයෙන් ක්‍රියා කිරීමට තැනැත්තකු අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. ඒ ඈවරකරුට පහත දැක්වෙන බලතල ඇත්තේ ය :—

(අ) ඒ ධීවර කමිටුවේ පොත්පත්, ලිපිලේඛන සහ වත්කම්වල සන්තකය භාර ගැනීමට ;

(ආ) ඒ ධීවර කමිටුවේ දේපළ විකිණීමට ;

(ඇ) ඒ ධීවර කමිටුවේ සාමාජිකයන් අතර ප්‍රමුඛත්වය පිළිබඳ යම් ප්‍රශ්නයක් නිරණය කිරීමට ;

(ඈ) ඒ ධීවර කමිටුව විසින් හෝ එයට විරුද්ධව හෝ ඉදිරිපත් කරනු ලැබූ හිමිකම්පෑමක්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව, සමථයකට පත් කිරීමට ; සහ

(ඉ) ඒ ධීවර කමිටුවේ වත්කම් නියමිත ආකාරයට බෙදාදීමට කළ යුතු පිළියෙල කිරීමට.

(8) ධීවර කමිටුවක් ඈවර කරනු ලබන අවස්ථාවක දී ඒ කමිටුවේ අරමුදල් පළමුකොට ඒ ඈවරකිරීමේ වියදම් පියවීම සඳහා ද ඉන්පසු ඒ කමිටුවේ බැරකම් පියවීම සඳහා ද යෙදිය යුතු ය. ඈවර කිරීම නිම කරනු ලැබීමෙන් පසු යම් අතිරික්තයක් තිබේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ධීවරයන්ගේ නාම ලේඛනය.

33. (1) සෑම ධීවර කමිටුවක් විසින් ම, ඒ කමිටුවේ බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින හෝ ධීවර කටයුතුවල නිරතවන ධීවරයන්ගේ නාම ලේඛනයක් නියමිත ආකාරයට සහ නියමිත ආකෘතියට අනුව පිළියෙල කිරීම ද, එය ප්‍රතිශෝධනය කිරීම ද, පවත්වාගෙන යාම ද කළ යුතු ය :

එසේ වුවද, එවැනි කමිටුවක බල ප්‍රදේශය තුළ පදිංචිව සිටින හෝ ධීවර කටයුතුවල නිරතව සිටින ධීවරයන්ගේ ප්‍රථම නාම ලේඛනය අධ්‍යක්ෂවරයා විසින් පිළියෙල කොට සහතික කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නාම ලේඛනය පිළියෙල කිරීමේ දී සහ ප්‍රතිශෝධනය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය පිළිබඳව නියෝග සාදනු ලැබිය හැකි අතර, පහත සඳහන් කාරණා සඳහා විධිවිධාන ඒ නියෝගවලින් සැලැස්විය යුතු ය :—

(අ) එවැනි ලේඛනයක තම නම ඇතුළත් කිරීමට හිමිකම් ඇතැයි ද තම නම ඒ ලේඛනයේ ඇතුළත් කොට නැතැයි ද කියා සිටින්නා වූ යම් තැනැත්තකු විසින් තම නම ඒ ලේඛනයේ ඇතුළත් කරවා ගැනීමට ඒ ධීවර කමිටුවෙන් ඉල්ලා සිටීමට :

(ආ) නම නම ඒ ලේඛනයේ ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ යම් තැනැත්තකු ඒ ලේඛනයේ නම ඇතුළත් කොට ඇති වෙනත් යම් තැනැත්තකුගේ නම එසේ ඇතුළත් කොට තිබීමට විරෝධය දක්වන අවස්ථාවක දී එකී වෙනත් තැනැත්තාගේ නම ඒ ලේඛනයෙන් ඉවත් කරන ලෙස ධීවර කමිටුවෙන් ඉල්ලා සිටීමට;

(ඇ) එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී ධීවර කමිටුව විසින් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පරිපාටිය, සහ

(ඈ) යම් ධීවර කමිටුවක් වෙත පවරන ලද ඉල්ලීමක් හෝ විරෝධය පෑමක් සම්බන්ධයෙන් ඒ ධීවර කමිටුව විසින් ගනු ලැබූ තීරණයට විරුද්ධව අධ්‍යක්ෂවරයා වෙත අභියාචනය කිරීම.

මසුන් ඇල්ලීම සඳහා වූ සංවෘත වාර හෝ විවෘත වාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි බව.

34. අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්—

(අ) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශවල සහ එසේම සඳහන් කාලවේලා ඇතුළත මසුන් ඇල්ලීම සඳහා සංවෘත වාරයක් හෝ විවෘත වාරයක්; සහ

(ආ) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශවල සහ එසේම සඳහන් මත්ස්‍ය විශේෂයක් ඇල්ලීම සම්බන්ධයෙන් සංවෘත වාරයක් හෝ විවෘත වාරයක්

ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම දැන්වීමක් ම, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ජාතික ප්‍රවෘත්ති පත්‍ර තුනක හෝ ඊට වැඩි ගණනක පළ කරනු ලැබිය යුතු අතර, මසුන් ඇල්ලීම හෝ යම් මත්ස්‍ය විශේෂයක් ඇල්ලීම සම්බන්ධයෙන් සංවෘත වාර හෝ විවෘත වාර ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රදේශයේ හෝ ප්‍රදේශවල පැහැදිලිව පෙනෙන ස්ථානයක හෝ ස්ථානවල එය ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සංවෘත වාරයක් තුළ දී—

(අ) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය හෝ ප්‍රදේශ තුළ මසුන් ඇල්ලීම; හෝ

(ආ) ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් මත්ස්‍ය විශේෂයක් ඒ ප්‍රදේශය හෝ ප්‍රදේශ තුළ දී ඇල්ලීම

කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

පර්යේෂණ හෝ විද්‍යාත්මක කාර්ය සඳහා ධීවර බෝට්ටු පාවිච්චි කිරීම.

35. (1) ශ්‍රී ලංකා ජල තීරයේ මත්ස්‍යයන්ට සහ ජලජ සම්පත් වලට අදාළ පර්යේෂණ කටයුතු, මසුන් ඇල්ලීම පිළිබඳ අත්හදා බැලීම හෝ විද්‍යාත්මක විමර්ශන සඳහා යම් දේශීය ධීවර බෝට්ටුවක් පාවිච්චි කිරීමට බලය දෙමින් අධ්‍යක්ෂවරයා විසින් ලිඛිත අවසරයක් දෙනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අවසරය දීමේ දී ඒ පර්යේෂණ කටයුතු, මසුන් ඇල්ලීම පිළිබඳ අත්හදා බැලීම හෝ විද්‍යාත්මක විමර්ශන සම්බන්ධයෙන් සුදුසු යයි තමන් අදහස් කරන කොන්දේසි නියම කරනු ලැබිය හැක් ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද ලිඛිත අවසරයේ බලය යටතේ සහ ඒ අනුව ක්‍රියා කරවනු ලබන සම් දේශීය ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් 6 වන වගන්තියේ සඳහන් ගාස්තුවක් අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද බලය යටතේ යම් දේශීය ධීවර බෝට්ටුවක් මෙහෙයවන යම් තැනැත්තකුට හෝ 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද ලිඛිත අවසරයේ බලය යටතේ සහ ඒ අනුව ධීවර බෝට්ටුවක් මෙහෙයවන යම් තැනැත්තකුට හෝ 31 වන වගන්තියේ හෝ 34 වන වගන්තියේ අඩංගු කිසිවක් අදාළ නොවිය යුතු ය.

## V වන කොටස

### සංරක්ෂණය

36. පහත දැක්වෙන කාර්ය සඳහා විශේෂ පියවර ගත යුතු යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක දී ඔහු විසින්, වන සත්ව සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විමසා, ශ්‍රී ලංකා ජල තීරයේ යම් ප්‍රදේශයක් හෝ ඊට යාබද යම් ගොඩබිම් ප්‍රදේශයක් හෝ ඒ ජල තීර ප්‍රදේශය සහ ගොඩබිම් ප්‍රදේශය යන දෙක ම හෝ ධීවර රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය :— ධීවර රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

(අ) ඒ ජල තීරයේ හෝ ගොඩබිම් ප්‍රදේශයේ අභාවයට යාමේ අන්තරායට මුහුණ දී ඇති ජලජ සම්පත් සඳහා විශේෂ ආරක්ෂාව සැලසීම සහ කොරල්වල වැඩීම හා ජලජ පරිසර පද්ධති කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව, මත්ස්‍යයන් සහ ජලජ සම්පත් බෝවන ස්වාභාවික ස්ථාන සහ ජීවත්වන ස්ථාන ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) ජල ජීවීන් අඩුවී ඇති ප්‍රදේශවල ජල ජීවීන්ගේ ප්‍රතිජනනය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ජලජ මාධ්‍යය ආරක්ෂා කිරීම;

(ඈ) ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් විද්‍යාත්මක අධ්‍යයන සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම; හෝ

(ඉ) ඒ ප්‍රදේශයේ ස්වාභාවික සෞන්දර්යය පවත්වාගෙන යාම සහ නැවැලීම.

37. නියමිත ගාස්තුව ගෙවා අධ්‍යක්ෂවරයාගෙන් හෝ තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත් තකුගෙන් ලබාගත් නියමිත ආකෘතියෙහි වූ අවසර පත්‍රයක් මත මිස, කිසිදු තැනැත්තකු විසින්— ධීවර රක්ෂිත ප්‍රදේශවල තහනම් දෑ

(ආ) ඒ රක්ෂිත ප්‍රදේශයේ කිසිදු ධීවර මෙහෙයුමක් නොකළ යුතු ය ;

(ඇ) ඒ රක්ෂිත ප්‍රදේශයෙහි කොරල් හෝ වෙනත් කිසිදු ජලජ සම්පත් කැණීම, එකතු කිරීම හෝ වෙනත් අයුරකින් රැස් කිරීම, වැලි හෝ බොරළු ගොඩ ගැනීම හෝ ඉවත් කිරීම, අපද්‍රව්‍ය හෝ වෙනත් කිසිදු අපවිත්‍රකාරක ද්‍රව්‍යයක් බැහැර කිරීම හෝ තැන්පත් කිරීම හෝ මත්ස්‍යයන්ට හෝ වෙනත් ජලජ සම්පත්වලට හෝ ඔවුන්ගේ ස්වාභාවික බෝවන ස්ථානවලට හෝ ජීවත්වන ස්ථානවලට වෙනත් කිසිදු අයුරකින් බාධා කිරීම, අවහිර කිරීම හෝ ඔවුන් හෝ ඒවා විනාශ කිරීම නොකළ යුතු ය ;

(ඈ) ඒ රක්ෂිත ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් හෝ ජල ප්‍රදේශයක් මත හෝ ඊට උඩින් යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් නිර්මාණයක් ඉදි නොකළ යුතු ය.

## VI වන කොටස

### ජලජීවී වගාව

38. ජාතික ආර්ථිකයේ හිත පිණිස අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පරිදි රජයේ ඉඩම්වල හෝ ශ්‍රී ලංකා ජල තීරයේ යම් කොටසක් රජයේ ඉඩම් ආඥාපනතේ විධිවිධානවලට යටත්ව ජලජීවී වගාව සඳහා බදු දෙනු ලැබිය යුතු ය. රජයේ ඉඩම් බදු දීම.

39. 40 වන වගන්තිය යටතේ දෙනු ලැබූ බලපත්‍රයක බලය යටතේ මිස, කිසිදු තැනැත්තකු විසින් ජලජීවී වගාව පිළිබඳ ව්‍යවසායක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය. ජලජීවී වගා ව්‍යවසායට බලපත්‍ර දීම.

40. (1) 39 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, ඒ ජලජීවී වගාව පිළිබඳ ව්‍යවසාය පවත්වා ගෙන යාමට අදහස් කරන පරිපාලන දිස්ත්‍රික්කයේ බලපත්‍ර දීමේ නිලධරයකු වෙත නියමිත ආකෘතිය අනුව සහ නියමිත ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. බලපත්‍රයක් සඳහා ඉල්ලීම.

(2) ජලජීවී ව්‍යවසාය ක්‍රියාත්මක කිරීමට යෝජිත පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පත් කළ බලපත්‍ර දීමේ නිලධරයකු නොමැති නම්, ඉල්ලීම අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා විසින්, ඉල්ලීමෙහි සඳහන් ජලජීවී ව්‍යවසාය ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ තමා විසින් වාර්තා ගත කළ යුතු හේතු මත එකී ව්‍යවසාය ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

41. මේ කොටස යටතේ ප්‍රදානය කරනු ලබන සෑම බලපත්‍රයක් බලපත්‍රයේ ආකෘතිය සහ එය බලපවත්නා කාලය.

(අ) නියමිත ආකෘතිය අනුව තිබිය යුතු ය ;

(ආ) කලින් අවලංගු කරනු නොලැබුවහොත් ඒ බලපත්‍රයේ සඳහන් කරන ලද කාලය තුළ බලපැවැත්විය යුතු ය; තවද

(ඇ) පරිසරය ආරක්ෂා කිරීම සඳහා පනවනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

42. (1) මේ පනතේ මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක කාලය ඉකුත් වීමට පෙර දින තිහකට නොඅඩු කාලයක් තිබිය දී, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කොට, නියමිත ගාස්තුව ගෙවා, ඒ බලපත්‍රය අලුත් කර ගනු ලැබිය හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා පහත සඳහන් කරුණු ගැන සෑහීමට පත් වුවහොත් පමණක්, බලපත්‍රයක් අලුත් කරනු ලැබිය යුතු ය:

(අ) බලපත්‍රයේ අඩංගු නියමයන් හා කොන්දේසි බලපත්‍රලාභියා විසින් පිළිපදිනු ලැබ ඇති බව; සහ

(ආ) ජලජීවී වගා ව්‍යවසාය දිගට ම පවත්වාගෙන යාම නිසා පරිසරයට හානි සිදු නොවන බව.

බලපත්‍රය අවලංගු කිරීම.

43. අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධරයා හෝ අධ්‍යක්ෂවරයා පහත සඳහන් කරුණු ගැන සෑහීමට පත් වුවහොත්, මේ කොටස යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් ඔහු විසින් අවලංගු කරනු ලැබිය හැකි ය:—

(අ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් හෝ ඒ බලපත්‍රයේ අඩංගු නියමයන් හෝ කොන්දේසි කිසිවක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කර තිබීම;

(ආ) බලපත්‍රලාභියා මේ පනත යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබ සිටීම; හෝ

(ඇ) ඒ ජලජීවී වගා ව්‍යවසාය දිගට ම පවත්වාගෙන යාම පරිසරයට හානිකර වීම.

## VII වන කොටස

## ධීවර ආරවුල් බේරුම් කිරීම

ධීවර ආරවුල් බේරුම් කිරීම.

44. (1) යම් ධීවර ආරවුල් උද්ගත වන්නාවූ හෝ උද්ගත විය හැකැයි සිතිය හැකි අවස්ථාවක දී, ඒ ධීවර ආරවුල පිළිබඳව පරීක්ෂණයක් කිරීම සඳහා, බලයලත් නිලධරයකු වෙත අධ්‍යක්ෂවරයා විසින් එය යොමු කරනු ලැබිය හැකි ය.

(2) යම් ධීවර ආරවුලක් බලයලත් නිලධරයකු වෙත (1) වන උපවගන්තිය යටතේ යොමු කරන ලද අවස්ථාවක දී, ඔහු විසින්, ඒ ආරවුලේ පාර්ශ්වකරුවන් කැඳවා, සමථයකට පත් කිරීම මඟින් ඒ ආරවුල බේරුම් කිරීමට උත්සාහ කළ යුතු ය.

(3) ධීවර ආරවුලක් බේරුම් කිරීමට බලයලත් නිලධරයාට හැකි වූයේ නම්, බේරුම් කිරීමේ නියමයන් ඇතුළත් සටහනක් ඔහු විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර ආරවුලේ පාර්ශ්වකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඊට අත්සන් කළ යුතු ය. ඒ බේරුම් කිරීමේ නියමයන්ගෙන් ඒ ආරවුලේ පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතු ය.

(4) බේරුම්කිරීමක් ඇති කිරීමට බලයලත් නිලධරයා අපොහොසත් වුවහොත්, ආරවුලේ පාර්ශ්වකරුවන් සහ ඔවුන්ගේ සාක්ෂිකරුවන් දක්වන කරුණුවලට සවන් දී ඔහු විසින් ඒ ආරවුල පිළිබඳව තීරණයක් කරනු ලැබිය යුතු ය.

(5) බලයලත් නිලධරයකු ඉදිරියේ පැවැත්වෙන පරීක්ෂණයක විෂය කරුණ වූ යම් ධීවර ආරවුලක් හෝ ඊට සම්බන්ධ, ඊට අදාළ හෝ ඉන් උද්ගත වන යම් කරුණක් බලපාන යම් තැනැත්තකුට ඒ පරීක්ෂණයට පෙනී සිටීමේ සහ ඒ ආරවුලට සම්බන්ධ වාචික හෝ ලේඛනමය කරුණු ඉදිරිපත් කිරීමේ හිමිකම ඇත්තේ ය.

(6) පරීක්ෂණයට භාජනය කරන ලද කාරණා සම්බන්ධයෙන් තමාගේ නිගමන සහ, එම කාරණා සම්බන්ධයෙන් සහ උද්ගත වූ හෝ උද්ගත වේ යයි සිතිය හැකි වූ ආරවුලට අදාළ ජල ප්‍රදේශයේ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් පාලනය කිරීමට හෝ නියාම කිරීමට අවශ්‍ය යයි ඔහු සලකන අයිතිවාසිකම්, සීමා කිරීම් හෝ තහනම් කිරීම් පිළිබඳව හෝ අදාළ වෙනත් යම් කරුණක් පිළිබඳව ඔහුගේ නිර්දේශ ඇතුළත් වාර්තාවක් පිළියෙල කිරීම බලයලත් නිලධරයාගේ කාර්ය වන්නේ ය. පරීක්ෂණය අවසානයේ දී ඒ වාර්තාව කියවනු ලැබිය යුතු ය. නියමිත ගාස්තුව ගෙවා ඒ වාර්තාවේ පිටපතක් ලබා ගැනීමේ හිමිකම ඒ ආරවුලේ පාර්ශ්වකරුවන්ට සහ ඒ වාර්තාව බලපාන වෙනත් යම් තැනැත්තකුට ඇත්තේ ය.

(7) ආරවුල තමා වෙත යොමු කරන ලද දින සිට මාසයක් ඇතුළත දී මේ වගන්තිය යටතේ වූ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට බලයලත් නිලධරයා උත්සාහ කළ යුතු ය. ඒ කටයුතු සඳහා වැඩි කාලයක් ඔහු විසින් ගනු ලබන අවස්ථාවක දී, ඊට හේතු ඔහු විසින් වාර්තාගත කළ යුතු ය.

(8) මේ වගන්තිය යටතේ පවත්වනු ලබන පරීක්ෂණයක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සැලැස්වන නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(9) මේ වගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලැබූ යම් ධීවර ආරවුලක් හෝ ඊට සම්බන්ධ, ඊට අදාළ හෝ ඉන් උද්ගත වන යම් කරුණක් බලපාන යම් තැනැත්තකු විසින්, ඒ ආරවුලට සම්බන්ධ වාර්තාවේ දින සිට මාසයක් ඉකුත් වීමට පෙර, ඒ වාර්තාවේ සඳහන් කර තිබෙන යම් කාරණාවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත ලිඛිත කරුණු සැලකිරීම් ඉදිරිපත් කළ හැකි ය.

(10) යම් ධීවර ආරවුලක් සම්බන්ධයෙන් (6) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්තාව සහ ඒ වාර්තාව සම්බන්ධයෙන් (9) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීම් සලකා බැලීමෙන් පසු, අමාත්‍යවරයා විසින්,—

(අ) යම් ධීවර දැලක හෝ ධීවර ආම්පන්නයක සහ අයිතිකරුගේ ලියාපදිංචි කිරීම අවලංගු කරමින් සහ ඒ ධීවර දැල හෝ ධීවර ආම්පන්නය සහ එහි අයිතිකරු වෙනුවට වෙනත්

යම් ධීවර දැලක් හෝ ධීවර ආම්පන්නයක් සහ එහි අයිතිකරු ලියාපදිංචි කිරීමට විධාන කරමින් නියමයක් කළ හැකි ය;

(ආ) පහත දැක්වෙන කාර්ය සඳහා වූ නියෝග ද ඇතුළුව, එම ආරාවුලේ විෂය කරුණ හෝ ඊට සම්බන්ධ නැතහොත් ඊට අදාළ හෝ ඉන් උද්ගත වන යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය:—

(i) නිශ්චිත ධීවර බෝට්ටු, ආම්පන්න සහ ධීවර ක්‍රම උපයෝගී කරගන්නා යම් නිශ්චිත කණ්ඩායමකට හෝ තැනැත්තන් කොටසකට අයත් නොවන තැනැත්තන්ට ශ්‍රී ලංකා ජල තීරයේ යම් නිශ්චිත කොටසක මසුන් ඇල්ලීම තහනම් කිරීම, සීමා කිරීම හෝ විධිමත් කිරීම; හෝ

(ii) ධීවර කටයුතුවල නියැලි විවිධ කණ්ඩායම් හෝ තැනැත්තන් කොටස් විසින් ශ්‍රී ලංකා ජල තීරයේ යම් නිශ්චිත කොටසක, මසුන් ඇල්ලීම කළ හැකි විවිධ දිනයන් හෝ වේලාවන් නියම කිරීම.

(11) යම් ආරාවුලකට සම්බන්ධ විෂය කරුණ පිළිබඳව සිවිල් නඩුවක් හෝ වෙනත් යම් සිවිල් නඩු කටයුත්තක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ විනිශ්චයට භාජනව තිබේ නම්, ඒ ආරාවුල මේ වගන්තිය යටතේ යොමු කිරීමට මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන කිසිවකින් බලය දෙනු ලබන ලෙස සැලකීම හෝ අර්ථ නිරූපණය කිරීම නො[illegible] යුතු ය.

[illegible]

45. (1) 44 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් සහ වාර්තාවක් සඳහා යොමු කරනු ලැබූ යම් ධීවර ආරාවුලක් හේතුකොට සාමය කඩවීමට ඉඩ තිබෙන බව අමාත්‍යවරයාට හැඟී යන අවස්ථාවක දී, ඒ සාමය කඩවීම වැළැක්වීම සඳහා අවශ්‍ය යයි තමා සලකන ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ (ආ) (i) සහ (ii) වන ඡේදවල සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් සලස්වනු ලැබිය හැකි ය.

(2) යම් ධීවර ආරාවුලක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා මඟින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් නියමයක්, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, ඒ ආරාවුල් සම්බන්ධයෙන් 44 (10) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් යම් නියෝග සාදනු ලැබුවහොත්, ඒ නියෝග ක්‍රියාත්මක වන දින සිට යට කී නියමය ක්‍රියාත්මක වීම නතර විය යුතු ය.

## VII වන කොටස

### බලයලත් නිලධරයන් සහ ඔවුන්ගේ බලතල

46. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ ද ධීවර පරීක්ෂකවරයකුගේ නිලයට පහළ නොවූ නිල දරන්නා වූ ද නිලධරයන් සංඛ්‍යාවකට, එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලය, අධ්‍යක්ෂවරයා විසින් දෙනු ලැබිය හැකි ය. එකී නිලධරයන් "බලයලත් නිලධරයන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ බලයලත් නිලධරයකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූල ව සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ පිළිපදිනු ලැබ තිබේදැයි තහවුරු කර ගැනීමේ කාර්යය සඳහා,—

(අ) ශ්‍රී ලංකා ජල තීරයේ ඇති යම් ධීවර බෝට්ටුවක් හෝ මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදී සිටින යම් දේශීය ධීවර බෝට්ටුවක් නැවැත්වීමට, ඊට ගොඩවීමට සහ එය සෝදිසි කිරීමට සහ ඒ බෝට්ටුව, එහි සිටින පිරිස, එහි ගෙනයනු ලබන ආම්පන්න සහ වෙනත් උපකරණ සහ ඒ බෝට්ටුවේ ඇති මසුන් හෝ වෙනත් ජලජ සම්පත් පරීක්ෂා කිරීමට ;

(ආ) මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් ප්‍රවාහනය කරන යම් වාහනයක් නැවැත්වීමට සහ සෝදිසි කිරීමට ; හෝ

(ඇ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ ලබාගත යුතු යයි හෝ පවත්වාගෙන යා යුතු යැයි නියමිත යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, පොතක්, සටහනක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීමට සහ එවායේ පිටපත් ගැනීමට

බලයලත් නිලධරයකුට බලය ඇත්තේ ය.

(4) මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බව විශ්වාස කිරීමට හේතු බලයලත් නිලධරයකුට ඇති අවස්ථාවක දී, වරෙන්තුවක් ඇතිව හෝ නැතිව,—

(අ) ඒ වරද සිදු කරනු ලැබූ ස්ථානය ලෙස විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති යම් ස්ථානයකට, දිවා කාලයේ සියලු සාධාරණ වේලාවන්හි ඇතුළු වී එය සෝදිසි කිරීම ;

(ආ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය වන සේ අල්ලා ගනු ලැබූ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් ගබඩා කොට ඇති හෝ තබා ඇති යම් ස්ථානයකට, දිවා කාලයේ සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළු වී ඒවා සෝදිසි කිරීම ;

(ඇ) (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ සෝදිසි කරනු ලබන යම් ස්ථානයක තිබී සොයාගනු ලැබූ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක සාම්පල ලබා ගැනීම ;

(ඈ) එවැනි යම් ස්ථානයක සිට හමු වූ ද, මේ පනත යටතේ වූ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදක් කළ තැනැත්තකු බවට විශ්වාස කිරීමට බලයලත් නිලධරයාට හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකු සිරභාරයට ගැනීම ;

(ඉ) මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ වරදක් කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ භාවිත කරන ලද්දේ බවට විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් බෝට්ටුවක්, එංජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ වාහනයක් හෝ දෙයක් තහනම්ව ගැනීම ;

(ඊ) එවැනි වරදක් සිදු කිරීමේ දී ගන්නා ලද හෝ, මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් උල්ලංඝනය කරමින් ගොඩ දමන ලද, විකුණන ලද, මිලට ගන්නා ලද, භාර ගන්නා ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද දේ බව විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති මත්ස්‍ය හෝ වෙනත් ජලජ සම්පත් හෝ ගබඩා කර ඇති ද්‍රව්‍ය හෝ නැති වී යන කිසිවක් තහනම්ව ගැනීම ; හෝ

(උ) මේ පනත උල්ලංඝනය කරමින් පාවිච්චි කරන ලද හෝ සන්තකයේ තබා ගන්නා ලද දේ බව විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති විෂ සහිත, පුපුරණ සුලු හෝ විසංඥකාරක ගෙන ආ යම් ද්‍රව්‍යයක් හෝ වෙනත් හිංසක හෝ හානිකර දෙයක් හෝ ද්‍රව්‍යයක් තහනම්ව ගැනීම

ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

(5) ධීවර බෝට්ටුවක් හෝ වෙනත් යම් දෙයක් (4) වන උපවගන්තිය යටතේ තහනම්ව ගනු ලබන අවස්ථාවක දී, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය තහනම්ව ගන්නා බලයලත් නිලධරයා විසින්, ප්‍රායෝගික ඉක්මණින්, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය නිසි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය සම්බන්ධයෙන් පවරනු ලබන යම් නඩු කටයුත්තක් තීරණය කරනු ලබන තෙක්, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය රඳවා තබා ගැනීම හෝ එහි භාර කරන්නාවූ පිළිබඳව සුදුසු යයි ඒ අධිකරණය අදහස් කරන ආඥා ඉන් ඒ අධිකරණය විසින් කළ යුතු ය :

එසේ වුවද, (4) වන උපවගන්තිය යටතේ තහනම්ව ගනු ලැබූ මත්ස්‍ය හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් ඉක්මණින් නරක්වීමට හැක්කා වේ නම්, ඒ මත්ස්‍ය හෝ වෙනත් ජලජ සම්පත් බලයලත් නිලධරයකු විසින් විකුණනු ලැබිය හැකි අතර, ඒ විකිණීමෙන් ලත් මුදල් ඒ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි තැන්පත් කරනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබූ සෑම තැනැත්තකුට ම, ඔහු සිරභාරයට ගැනීමට හේතුව දැනුම් දිය යුතු අතර, වරෙන්තුවක් නැතිව සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී නම් ඒ ආසන්නතම ඇති පොලිස් ස්ථානයට යවන්නේ ඒ තැනැත්තා සිරභාරයට ගනු

ලැබූ ස්ථානයේ සිට අධිකරණය දක්වා ගෙනයාමට ගත වන කාලය අත හැර, එසේ සිරභාරයට ගත් වේලාවේ සිට පැය විසිහතරක් තුළ දී ඒ තැනැත්තා නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පැහැර හැරීමක දී උකස් කළ ධීවර බෝට්ටු ඇන්ජින් සහ ධීවර ආම්පන්න තහනමට ගැනීමේ සහ ඉවත් කිරීමේ බලය.

47. (1) යම් ධීවර බෝට්ටුවක්, ඇන්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්න හෝ උපකරණ කිසිවක් සම්බන්ධයෙන් ආණ්ඩුව සහ යම් තැනැත්තකු අතර ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් මත ආණ්ඩුවට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම ඒ තැනැත්තා විසින් පැහැර හරින ලද අවස්ථාවක දී, ඒ ධීවර බෝට්ටුව, ඇන්ජිම, ධීවර දැල හෝ වෙනත් ආම්පන්නය හෝ උපකරණය තහනමට ගෙන ඉවත් කිරීමට ලිඛිත බලය, අධ්‍යක්ෂවරයා විසින්, බලය ලත් නිලධරයකුට දෙනු ලැබිය හැකි ය.

(2) යම් ධීවර බෝට්ටුවක්, ඇන්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් (1) වන උපවගන්තිය යටතේ තහනමට ගැනීමේ කාර්යය සඳහා, ධීවර බෝට්ටුව, ඇන්ජිම, ධීවර දැල හෝ වෙනත් ධීවර ආම්පන්නය හෝ උපකරණය තබා ඇත්තේ යයි විශ්වාස කිරීමට බලයලත් නිලධරයකුට හේතු ඇති යම් ස්ථානයකට ඇතුළු වී ඒ ස්ථානය ඒ බලයලත් නිලධරයා විසින් සෝදිසි කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් ගිවිසුමක් මත ආණ්ඩුවට ලැබිය යුතු යම් මුදලක්, තත් කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව අයකර ගැනීම, මේ වගන්තියේ ඇතුලත් කිසිවකින් වළක්වනු ලබන්නේ යයි නොසැලකිය යුතු ය.

නිල ඇඳුමින් නොසැරසුණු බලයලත් නිලධරයකු තම නිලය ප්‍රකාශ කළ යුතු බව.

48. (1) බලයලත් නිලධරයකු මේ පනතේ විධිවිධාන යටතේ ක්‍රියා කරන අවස්ථාවක දී, තම නිලය ඔහු විසින් ප්‍රකාශ කළ යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා තමා බලයලත් නිලධරයකු බව පෙන්නුම් කිරීමට සාධාරණ ලෙස ප්‍රමාණවත් අනන්‍යතාවක් ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(2) යම් බලයලත් නිලධරයකු තම නිලය ප්‍රකාශ කිරීම සහ මේ පනතේ කාර්ය සඳහා තමා බලයලත් නිලධරයකු බව පෙන්නුම් කිරීමට සාධාරණ ලෙස ප්‍රමාණවත් අනන්‍යතාවක් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත්, ඒ බලයලත් නිලධරයා විසින් කරනු ලැබූ අයදුමක්, ඉල්ලීමක් හෝ අණක් පිළිපැදීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම වරදක් නොවන්නේ ය.

## IX වන කොටස

## වැරදි සහ දණ්ඩන

වැරදි.

49. (1) මේ පනතේ 15, 16, 17 හෝ 22 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කර හෝ 30 වන වගන්තිය යටතේ කරනු ලැබූ විධානයක් පිළිපැදීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනතේ

යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනතේ 6, 28, 29, 34, 35 හෝ 39 වන වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ විධිවිධාන පිළිපැදීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් තුන් දහසකට අඩු නොවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ ඒ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) මේ පනතේ 27 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටයත් වරදකට වරදකරු වන අතර. මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මාස හයකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට හෝ, දෙවන නැතහොත් තදනන්තර වාරයක දී වරදකරු කිරීමක දී එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් දස දහසකට නොඅඩු දඩයකට ඔහු යටත් විය යුතු ය.

(4) (අ) බලයලත් නිලධරයකු විසින් නියම කරනු ලැබූ විට, ශ්‍රී ලංකා ජල තීරයේදී හෝ ශ්‍රී ලංකා ජල තීරයේ සීමාවෙන් පිටත දී යම් ධීවර බෝට්ටුවක් නැවැත්වීම හෝ මසුන් නැතහොත් වෙනත් ජලජ සම්පත් කිසිවක් ප්‍රවාහනය කරන යම් වාහනයක් නැවැත්වීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන ;

(ආ) බලයලත් නිලධරයකු ඉදිරියේ පෙනී සිටින ලෙස 44 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කැඳවනු ලැබූ විට එසේ පෙනී සිටීම පැහැර හරින හෝ 44 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ඇතුළත් වූ බැරුම් කිරීමක පාර්ශ්වකරුවකු වී සිටිමින් ඒ බැරුම් කිරීමේ නියමයන් පිළිපැදීම පැහැර හරින ;

(ඇ) යම් බෝට්ටුවක් හෝ එහි යාත්‍රිකයන් පිරිස එහි ගෙන යනු ලබන ධීවර ආම්පන්න සහ වෙනත් උපකරණ සහ එහි තිබෙන මසුන් හෝ වෙනත් ජලජ සම්පත් හෝ, මසුන් නැතහොත් වෙනත් ජලජ සම්පත් ප්‍රවාහනය කරන යම් වාහනයක්, බලයලත් නිලධරයකු විසින් සෝදිසි කරනු ලැබීමට සහ පරීක්ෂා කරනු ලැබීමට ඉඩ නොදෙන ;

(ඇ) 46 වන වගන්තියෙන් තමා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ක්‍රියා කරන බලයලත් නිලධරයකු විසින් සෝදිසි කරනු ලැබීම ප්‍රතික්ෂේප කරන, ඔහුට බාධා කරන හෝ ප්‍රතිරෝධය දක්වන හෝ ඔහුගේ අත්-අඩංගුවෙන් පැන යන හෝ පැනයාමට තැත් කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට අඩු නොවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(5) මේ පනත යටතේ සාදන ලද්දා වූ හෝ මේ පනත මගින් බලාත්මක කොට තබාගෙන ඇත්තා වූ හෝ යම් නියෝගයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේදී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, මාස හය කට නොඅඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දෙදහසකට නොවැඩි දඩය කට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ ඒ දඩය යන දෙකටම ඔහු යටත් විය යුතුය :

එසේ වුවද, හැඹිලි දැල්වලින් මසුන් ඇල්ලීම තහනම් කෙරෙන එවැනි යම් නියෝගයක් උල්ලංඝනය කිරීමේ වරදක් සඳහා වරද කරු කිරීමක දී, දඩය රුපියල් දසදහසකට නොවැඩි විය යුතු ය.

50. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක දී— පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම්, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, ලේකම්වරයකුව හෝ වෙනත් ඒ හා සමාන නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජික යකුව හෝ හවුල්කරුවකු ව සිටි සෑම තැනැත්තකු ම,

ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම සඳහා තමා නිසි පූර්ණ උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කළහොත් මිස, ඒ වරදට වරදකරු වන්නේ යැයි සැලකිය යුතු ය.

51. (1) මේ පනත යටතේ යම් වරදකට යම් තැනැත්තකු වරද කරු කරනු ලැබූ අවස්ථාවක දී,— රාජසන්තක කිරීම.

(අ) ඒ වරද කිරීමේ දී හෝ ඒ වරද සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් ධීවර බෝට්ටුවක්, ඇන්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ යම් වාහනයක් හෝ දෙයක් ; හෝ

(ආ) ඒ වරද කිරීමේ දී අල්ලා ගන්නා ලද හෝ ගනු ලැබූ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් හෝ එවැනි මසුන් හෝ වෙනත් ජලජ සම්පත් විකිණීමෙන් උපලබ්ධව 46 වන වගන්තිය යටතේ අධිකරණයේ තැන්පත් කොට ඇති මුදල්

ඒ වරදකරු කිරීම ප්‍රකාර රාජසන්තක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ක්‍රියාත්මකවීමෙන් රාජසන්තක වූ යම් ධීවර බෝට්ටුවක්, ඇන්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ යම් වාහනයක් හෝ දෙයක් හෝ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් හෝ 46 වන වගන්තිය යටතේ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් විකුණා උපලබ්ධව අධිකරණයේ තැන්පත් කොට ඇති මුදල් නිරවශේෂයෙන් රජය සතු වන්නේ ය. ඒ සතුවීම—

(අ) ඒ රාජසන්තකවීම සිදුවූයේ යම් වරදකරු කිරීමක් ප්‍රකාර ද ඒ වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් අභියාචනාධිකරණය වෙත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත හෝ ඉදිරිපත් කර නොමැති විටක එය ඉදිරිපත් කළ හැකි කාල පරිච්ඡේදය ඉකුත් වූ පසු හෝ,

(ආ) ඒ වරදකරු කිරීමට එරෙහිව අභියාචනයක් අභියාචනාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ඉදිරිපත් කර ඇත්තා වූ හෝ අවස්ථාවෝචිත පරිදි අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තා වූ විටක ඒ වරදකරු කිරීම ස්ථිර කරමින් හෝ අනුමත කරමින් ඒ අභියාචනය තීරණය කරනු ලැබූවිට

බලාත්මක විය යුතු ය.

(3) ඉන්පසු, (2) වන උපවගන්තිය යටතේ රජය වෙත සතු වූ යම් ධීවර බෝට්ටුවක, ඇන්ජිමක, ධීවර දැලක හෝ වෙනත් ධීවර ආම්පන්නයක හෝ උපකරණයක හෝ යම් වාහනයක හෝ දෙයක හෝ මසුන්ගේ හෝ වෙනත් ජලජ සම්පත්වල සන්තකය අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ, ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ගනු ලැබිය යුතු අතර ඒවා විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කරනු ලැබිය හැකි ය.

(4) යම් ධීවර බෝට්ටුවක්, ඇන්ජිමක්, ධීවර දැලක්, හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ යම් වාහනයක් හෝ දෙයක් හෝ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් (3) වන උපවගන්තිය යටතේ විකිණීමෙන් උපලබ්ධ වන මුදල්, අධ්‍යක්ෂ ජනරාල් විසින්, ධීවර කාර්ය අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ රජය වෙත සතු වූ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් විකිණීමෙන් උපලබ්ධ වන මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින්, ධීවර කාර්ය අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

52. (1) මේ පනත යටතේ වූ වරදක් නොවන යම් වරදක් මේ පනතේ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරමින් කර ඇති අවස්ථාවක දී, පළමු වරට වරදකරුවකු වන වරදකරුවකු සම්බන්ධයෙන් වන විට, ඒ වරද කිරීමට අදාළ පරිවේෂණ සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂවරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් අඩක් ඉක්මවා නොයන මුදලකට සමාන මුදලක් සඳහා ඒ වරද සමථයකට පත් කිරීම ද 46(4) වන වගන්තිය යටතේ අල්ලා ගනු ලැබ ඇත්තා වූ ද 46(1) වන වගන්තිය යටතේ රඳවා තබා ගැනීමේ ආඥාවක් මහේස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කොට නොමැත්තා වූ ද යම් ධීවර බෝට්ටුවක්, ඇත්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ යම් වාහනයක් හෝ දෙයක් හෝ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් ඇස්තමේන්තු කළ වටිනාකම ඉක්මවා නොයන මුදලක් ගෙවීම මත ඒ ධීවර බෝට්ටුව, ඇත්ජිම, ධීවර දැල හෝ වෙනත් ධීවර ආම්පන්නය හෝ උපකරණය හෝ වාහනය හෝ දෙය හෝ මසුන් හෝ ජලජ සම්පත් හෝ මුදා හරින ලෙස නියම කිරීම ද කරනු ලැබිය හැකි ය.

වැරදි සමථයකට පත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීම පිළිබඳව ඒ වරද කිරීම සම්බන්ධයෙන් නඩු පවරා ඇත්නම් මහේස්ත්‍රාත් අධිකරණය වෙත, දෙපාර්තමේන්තුවේ අත්සන් සහිතව, ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු අතර ඒ සමථයකට පත් කිරීමෙන් නිදොස් කිරීමක බලපෑම ඇත්තේ ය.

53. (1) මහේස්ත්‍රාත්වරයකු විසින් 46 (5) වන වගන්තිය යටතේ ධීවර බෝට්ටුවක් හෝ වෙනත් දෙයක් රඳවා තබා ගැනීමේ ආඥාවක් කර ඇති අවස්ථාවක දී අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ඇපකරුවන් හෝ වෙනත් ඇපයක් ඉදිරිපත් කිරීම මත ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය නිදහස් කරන ලෙස ඉල්ලීමක් ඒ බෝට්ටුවේ හෝ වෙනත් දෙයෙහි අයිතිකරු විසින් හෝ ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය තමන්ට අල්ලා ගත් කාලයේ දී එහි භාරකරුව සිටි තැනැත්තා විසින් හෝ ඒ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඇප මත බෝට්ටු ආදිය මුදා හැරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමාණයක ඇපකරුවන් විසින්, ඒ ධීවර බෝට්ටුව අල්ලා ගනු ලැබූ අවස්ථාවේ දී ඒ තුළ තිබුණු සියලු ධීවර ආම්පන්න, උපකරණ, රසායන ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය ඇතුළුව ඒ ධීවර බෝට්ටුවේ වටිනාකම සහ ඒ ධීවර බෝට්ටුවේ වූ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් කිසිවක් 46 (5) වන වගන්තියේ විධානයේ අනුකූලව විකුණා ලත් ප්‍රතිලාභ වූ මුදල් අධිකරණයේ තැන්පත් කොට ඇත් නම් එවැනි මසුන් සහ ජලජ සම්පත් හැර එහි වූ මසුන් සහ වෙනත් ජලජ සම්පත්වල වටිනාකම ඇතුළුව ඒ ධීවර බෝට්ටුවේ මුළු වටිනාකමට නොඅඩු මුදල් ප්‍රමාණයක බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබූ විට හෝ, අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් ඇපයක් තබනු ලැබූ විට, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය මුදා හැරීමට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

(3) බැඳුම්කරයක අඩංගු නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක දී, ඒ බැඳුම්කරයේ සඳහන් මුදල් ප්‍රමාණය අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් වූ පරිද්දෙන් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් සම්පූර්ණයෙන් අයකර ගනු ලැබිය හැකි විය යුතු ය.

[illegible]

54. (1) මේ පනතේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකා ජල තීරයේ කවර වුවද ස්ථානයක, කවර වුවද වේලාවක දී යම් ධීවර බෝට්ටුවක තිබී සොයා ගනු ලබන මසුන් කිසිවක්—

(i) ඒ බෝට්ටුවේ අයිතිකරු ඒ අවස්ථාවේ දී ඒ බෝට්ටුවේ සිටියේ නම් හෝ ඒ අවස්ථාවේ දී ඒ බෝට්ටුවේ කිසිවකු නොසිටියේ නම්, ඒ අයිතිකරු විසින් අල්ලනු ලැබූ මසුන් බව ; හෝ

(ii) ඒ අවස්ථාවේදී බෝට්ටුවේ අයිතිකරු එහි නොසිටියේ නම්, ඒ කාලයේ ඒ බෝට්ටුවේ සිටින්නා වූ ද ඒ බෝට්ටුවේ පාලනය දරන්නා වූ තැනැත්තා විසින් අල්ලනු ලැබූ මසුන් බව,

ඊට පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක් පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(2) මසුන් කිසිවක් සම්බන්ධයෙන් 27 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් පවරනු ලැබූ යම් නඩුවක දී පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක් ඒ මසුන් ශ්‍රී ලංකා ජල තීරයේ දී අල්ලා ගනු ලැබූ මසුන් බව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.—

[illegible]

55. (1) විෂ සහිත, පුපුරණ සුලු හෝ විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ මසුන්ට විෂ කැවීමේ, මසුන් මැරීමේ හෝ විසංඥභාවයට පත් කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කළ හැකි වෙනත් යම් හිංසක හෝ හානිකර ද්‍රව්‍යයක් හෝ දෙයක් ශ්‍රී ලංකා ජල තීරයේ පාවිච්චි කර ඇති බව ඔප්පුවීමෙන් ඉක්බිතිව ම ඒ ද්‍රව්‍යය හෝ දෙය ශ්‍රී ලංකා ජල තීරයේ ඒ ප්‍රදේශය අවට යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබී සම්භ වූ අවස්ථාවක දී, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, ඒ තැනැත්තා විසින් ඒ ද්‍රව්‍යය හෝ දෙය ඉහත සඳහන් කාර්යය සඳහා පාවිච්චි කරනු ලැබූ බවට පූර්ව නිගමනය කළ යුතු ය

(2) විෂ සහිත, පුපුරණ සුලු හෝ විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් හෝ, මසුන්ට විෂ කැවීමේ, මසුන් මැරීමේ හෝ විසංඥභාවයට පත් කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කළ හැකි වෙනත් යම් හිංසක හෝ හානිකර ද්‍රව්‍යයක් හෝ දෙයක්, ශ්‍රී ලංකා ජල තීරයේ යම් ධීවර බෝට්ටුවක සිටින යම් තැනැත්තකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ තිබී සම්භ වූ අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඒ ද්‍රව්‍යය හෝ දෙය ඉහත සඳහන් කාර්යය සඳහා පාවිච්චි කිරීමට ගෙන යමින් සිටි බව, ඊට පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, පූර්ව නිගමනය කළ යුතු ය.

[illegible]

56. මේ පනත යටතේ කරන ලැබූ යම් නියෝගයකින් ශ්‍රී ලංකා ජල තීරයේ යම් නිශ්චිත ප්‍රදේශයක පාවිච්චි කිරීම තහනම් කොට ඇති යම් ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක්, ඒ ජල ප්‍රදේශයේ සිට සැතපුම් භාගයක දුර ප්‍රමාණය තුළ යම් තැනැත්තකුගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබී

කොයා ගනු ලැබූ අවස්ථාවක දී, ඒ නියෝගය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් ඒ ධීවර දැල හෝ වෙනත් ධීවර ආම්පන්නය හෝ උපකරණය ඒ ජල ප්‍රදේශයෙහි පාවිච්චි කරනු ලැබූ බව ඊට පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, පූර්ව නිගමනය කළ යුතු ය.

57. මේ පනත යටතේ යම් වරදක් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරය තුළ දී හෝ ඉන් පිටත දී කරනු ලැබූ අවස්ථාවක දී,— මුහුදේ දී කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධිකරණ බලය.

(අ) ඒ වරද කරනු ලැබූ ස්ථානයට සමීපතම වෙරළ ප්‍රදේශය විෂයෙහි ; හෝ

(ආ) ඒ වරද කිරීමෙන් පසු ඒ තැනැත්තා ගොඩට එන ස්ථානය විෂයෙහි

අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට, ඒ වරද පිළිබඳ නඩු විභාග කිරීමේ අධිකරණ බලය ඇත්තේ ය.

## X වන කොටස

### සාමාන්‍ය

58. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී, එක් එක් පළාතේ ධීවර මෙහෙයුම්වලට බලපාන කරුණු සම්බන්ධයෙන් ඒ එක් එක් පළාතේ අමාත්‍ය මණ්ඩලයේ ධීවර විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසනු ලබන බවට වග බලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. පළාත් සභා බලධරයන් විමසීම.

59. (1) ධීවර ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ත්‍යාග අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග අරමුදල.

(2) ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

(3) 51(4) වන වගන්තිය යටතේ කරනු ලබන විකිණීම්වලින් උපලබ්ධ වන සියලු මුදල් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා විසින්, කලින් කල—

(අ) 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් නිලධරයකුට ;

(ආ) යම් බලයලත් නිලධරයකුට ; හෝ

(ඇ) යම් තොරතුරු සපයන්නකුට

සුදුසු යයි අධ්‍යක්ෂවරයා සලකන මුදල් ප්‍රමාණයක් ත්‍යාග අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය. එසේ වුවද, ඒ මුදල් ප්‍රමාණය, මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියමිත උපරිම මුදල් ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.

(5) ත්‍යාග අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, විගණකාධිපතිවරයා විසින් වර්ෂයක් පාසා විගණනය කරනු ලැබිය යුතු ය.

මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය මත සෙස් බද්දක් පැනවීම.

**60.** (1) ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවා ඇති යම් බද්දකට අමතරව, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් කලින් කල තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව සෙස් බද්දක් පනවා නියම කර අය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "මත්ස්‍ය නිෂ්පාදන" යන්නෙන් මසුන්ගෙන් සහ වෙනත් ජලජ සම්පත් වලින් පිළියෙල කරනු ලබන කෑමට ගත හැකි හෝ නොහැකි නිෂ්පාදන අදහස් වන අතර ඊට නැවුම්, ශීතකල, සැකසූ හෝ ටින් කළ නිෂ්පාදන, මාළු තෙල්, මාළු පොහොර සහ පොහොර ඇතුළත් වේ.

(2) එකී සෙස් බද්ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කොට, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය, රේගු ආඥාපනතේ කොටසක් වූ පරිද්දෙන් අදාළ විය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

නියෝග.

**61.** (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතේ සඳහන් හෝ මේ පනතින් නියමිත හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දෙනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු කාරණා ;

(ආ) විවිධ ධීවර කාර්මික කටයුතු හෝ මසුන් ඇල්ලීමේ ක්‍රම සඳහා ශ්‍රී ලංකා ජල තීරයේ නිශ්චිත ප්‍රදේශ වෙන් කිරීම ;

(ඇ) සියලුම වර්ගවල ධීවර බෝට්ටු ඉදිකිරීම ;

(ඈ) ලියාපදිංචි කළ ධීවර බෝට්ටු ලකුණු කිරීමේ වර්ගය, විශාලත්වය සහ ආකාරය ;

(ඉ) ධීවර බෝට්ටු කලින් කල පරීක්ෂා කිරීම සහ මුහුදේ යාත්‍රා කිරීම සඳහා සුදුසු බවට ඒවා සහතික කිරීම සහ ඒ පරීක්ෂා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ;

(ඊ) ශ්‍රී ලංකා ජල තීරයේ යොදවා ඇති දේශීය ධීවර බෝට්ටුවල අයිතිකරුවන් විසින් පිළිපැදිය යුතු යාත්‍රා කිරීමේ අවම ද්‍රව්‍ය සහ ඔවුන් විසින් තබා ගත යුතු ආරක්ෂක උපකරණ ;

(උ) දේශීය ධීවර බෝට්ටුවල අයිතිකරුවන් විසින් පිළිපැදිය යුතු ඒ බෝට්ටුවල මිනිසුන් යෙදවීමේ අවම ප්‍රමිති ;

(ඌ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඒ ජල තීරයේ යම් කොටසක පාවිච්චි කරනු ලබන ධීවර ඇල් හෝ වෙනත් නිශ්චිත ධීවර ආම්පන්න හෝ උපකරණ සහ ඒවායේ අයිතිකරුවන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි කළ යුතු විස්තර, ඒ ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු සහ ලියාපදිංචි කළ ධීවර ආම්පන්න හෝ උපකරණ ලකුණු කිරීම ;

(ඔ) ජලජ මාධ්‍යය ආරක්ෂා කිරීම ;

(ක) මසුන් සහ වෙනත් ජලජ සම්පත් ඇල්ලීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ යම් නිශ්චිත උපකරණයක්, උපක්‍රම යක්, ක්‍රමයක් හෝ ද්‍රව්‍යයක් පාවිච්චි කිරීම තහනම් කිරීම සහ මසුන් සහ වෙනත් ජලජ සම්පත් ඇල්ලීම කළ යුතු කාලය සහ ආකාරය විධිමත් කිරීම ;

(ඛ) 46 වන වගන්තියෙන් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම ;

(ග) මසුන් සහ වෙනත් ජලජ සම්පත් ඇල්ලීම සහ ගොඩබෑම සහ, ගොඩබාන ප්‍රදේශ පාලනය කිරීම සහ කළමනා කරණය කිරීම ;

(ඝ) මසුන් සහ වෙනත් ජලජ සම්පත් සම්බන්ධ කටයුතු කිරීම සහ ඒවා බෙදා හැරීම විධිමත් කිරීම සහ මසුන්ගේ මත්ස්‍ය නිෂ්පාදනවල සහ වෙනත් ජලජ සම්පත්වල තත්ත්වය පවත්වාගෙන යාම ;

(ච) ධීවර වරාය, මාලු කොටු, ධීවර ආම්පන්න, ඉණිවල බඳින දැල් සහ මසුන් ඇල්ලීම සඳහා භාවිත කරනු ලබන වෙනත් එවැනි උපකරණ ඉදිකිරීම සහ පාවිච්චිය තහනම් කිරීම, විධිමත් කිරීම හෝ පාලනය කිරීම ;

(ඡ) රක්ෂිත ධීවර ප්‍රදේශ කළමනාකරණය කිරීම, විධිමත් කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ජ) මසුන් සහ වෙනත් ජලජ සම්පත් පිරිසැකසුම් කිරීමේ ආය තන සඳහා බලපත්‍රදීම සහ ඒ බලපත්‍රවලට ඇතුළත් කළ යුතු කොන්දේසි ;

(ට) ජලජීවී වගාව කළමනාකරණය කිරීම සහ විධිමත් කිරීම ;

(ඩ) මිරිදිය ධීවර කටයුතු කළමනාකරණය කිරීම ;

(ණ) මසුන් ඇල්ලීමේ, අලෙවි කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ සහ ජල ජීවී වගා ව්‍යවසායවල නිරතව සිටින තැනැත්තන් විසින් සංඛ්‍යා ලේඛන රැස් කිරීම සහ තොරතුරු සැපයීම.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නියම්කොට සඳහන් කර ඇති යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරන ලැබීමෙන් පසු පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත හැකි තාක් ඉක්මනින් ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක්, එය අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට එක් හානියක් නොවිය

(4) යම් නියෝගයක් (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

...මා කිරීම

62. (1) මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර සද්භාවයෙන් කරනු ලැබූ හෝ එවැනි විධිවිධානයක් ප්‍රකාර සද්භාවයෙන් සිදු කරන ලදැයි අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ යම් නිලධරයකුට හෝ 46 වන වගන්තිය යටතේ බලය දෙනු ලැබූ යම් නිලධරයකුට හෝ විරුද්ධව වන්දි ඉල්ලා යම් සිවිල් අධිකරණයක නඩු පවරනු ලැබිය නොහැකි ය.

(2) 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ 43 වන වගන්තිය යටතේ බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර කරන ලද හෝ එවැනි විධිවිධානයක් ප්‍රකාර කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් පවරනු ලබන නඩුවක්, පැමිණිලි කරනු ලබන ක්‍රියාව කළ දින සිට මාස හයක් ඇතුළත දී පවරන ලද්දේ නම් මිස කිසිදු අධිකරණයක් විසින් භාර නොගත යුතු ය.

...වත් කිරීම.

63. 212 වන අධිකාරය වූ ධීවර ආඥාපනත, 213 වන අධිකාරය වූ හක් බෙලි පනත 214, වන අධිකාරය වූ මුතු බෙල්ලන් පිළිබඳ ආඥාපනත සහ 215 වන අධිකාරය වූ තල් මසුන් ඇල්ලීමේ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

...දැහන් කිරීම.

64. ධීවර ආඥාපනත ඉවත් කරනු ලැබුවද—

(අ) ඒ ආඥාපනත යටතේ සාදනු ලැබූ ද, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙර දිනයේ බලාත්මකව පැවතියා වූ ද සියලු නියෝග මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවලට අනනුකූල නොවනතාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග පරිද්දෙන් බලාත්මකව පැවතිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් ඒවා සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය ;

(ආ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී, ඒ ආඥාපනත යටතේ විභාගයට පාත්‍ර වී හෝ අවසාන නොවී හෝ පවත්නා සියලු නඩු, නඩු පැවරීම්, නඩු කටයුතු හෝ ධීවර ආරාවුල් පිළිබඳ යොමු කිරීම්, ධීවර ආඥාපනතේ විධිවිධාන ඉවත් නොකරන ලද්දාක් මෙන්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයෙන් පස පවත්වා ගෙන ගොස් අවසාන කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ ආඥාපනතේ 36 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ධීවර ත්‍යාග අරමුදලේ බැරට, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙර දිනයේ දී ඇති සියලු මුදල්, මේ පනතේ 59 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ධීවර ත්‍යාග අරමුදලට පැවරෙන්නේ ය ;

(ඈ) ඒ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ද මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී බලාත්මකව පැවතියා වූ ද, සෑම උකස් සාධන පත්‍රයක් සහ සෑම පැවරුම් සාධන පත්‍රයක් මේ පනත යටතේ ලියා පදිංචි කරනු ලැබූ සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) ඒ ආඥාපනත යටතේ නිකුත් කරනු ලැබ හෝ කරනු ලැබ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙර දිනයේ දී බලාත්මකව පැවති සියලු අවසර පත්‍ර සහ බලපත්‍ර, සහ ලියාපදිංචි කිරීම් මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ හෝ කරනු ලැබූ අවසර පත්‍ර හෝ බලපත්‍ර හෝ ලියාපදිංචි කිරීම් ලෙස සල කනු ලැබිය යුතු ය.

65. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

66. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ,— අර්ථ නිරූපණය.

"ජලජීවී වගාව" යන්නෙන්, නිෂ්පාදනය වැඩි කිරීමේ කාර්යය සඳහා මිනිස් පාලනය යටතේ ජලජ ජීවීන් ප්‍රජනනය කිරීමේ සිට ජලජ ජීවියකුගේ ජීවිතයේ යටත් පිරිසෙයින් එක් අදියරක් සම්පූර්ණයෙන්ම දක්වා වූ පරාස තුළ ජලජ ශාක සහ ජීවීන් ඇති කිරීම අදහස් වේ ;

"ජලජීවී වගා ව්‍යාපෘතිය" යන්නෙන්, වාණිජ කාර්ය සඳහා ජලජ ශාක හෝ ජලජ ජීවීන් වගාකිරීම සඳහා පිහිටුවනු ලැබූ හෝ භාවිත කරනු ලබන යම් ප්‍රදේශයක්, කොරටුවක්, පොකුණක්, කොටුකළ ස්ථානයක්, පරිශ්‍රයක් හෝ ව්‍යුහයක් අදහස් වන අතර, යම් වගා කළ මුතු බෙල්ලන් හෝ වෙනත් බෙල්ලන් ඇති කරන ජලාශ පත්ලක් හෝ පසුරක් හෝ මුතු බෙල්ලන් හෝ වෙනත් බෙල්ලන් වගාකිරීම සඳහා භාවිත කරනු ලබන වෙනත් ව්‍යුහයක් ඊට ඇතුළත් වේ :

"ජලජ මාධ්‍යය" යන්නෙන්, මසුන් සහ වෙනත් ජලජ සම්පත් දක්නට ලැබෙන යම් මාධ්‍යයක් අදහස් වේ ;

"ජලජ සම්පත්" යන්නෙන්, සජීවී ජලජ ඓන්ද්‍රීයයන් අදහස් වන අතර, ජලජ මාධ්‍යයක දක්නට ලැබෙන මූදු පැලෑටි, සහ ප්ලවාංග හෝ වෙනත් ජලජ උද්භිද වර්ග සහ අජීවී ද්‍රව්‍ය ඊට ඇතුළත් වේ;

"බලයලත් නිලධරයා" යන්නෙන්, 45(1) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු අදහස් වන අතර, සාජන්ට්වරයකුගේ නිලයට පහළ නොවූ නිලයක් දරන යුධ හමුදා, ගුවන් හමුදා හෝ පොලිස් නිලධරයකු හෝ සුළු නිලධාරී නිලයට පහළ නොවූ නිලයක් දරන නාවුක හමුදා නිලධරයකු ඊට ඇතුළත් වේ;

"ජෛව සම්පත් කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පනතේ 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයක් මගින් ශ්‍රී ලංකාවේ ජෛව සම්පත් කලාපය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය අදහස් වේ;

"අපනයනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ සීමාවලින් පිටත සමුද්‍රයට හෝ විදේශයකට ගෙන යාම අදහස් වේ;

"මසුන්" යන්නෙන්, මත්ස්‍ය ගණයට අයත් වන හෝ නොවන හෝ කවර වූවද ජලජ ජීවියකු අදහස් වන අතර, යම් පොතු සහිත මත්ස්‍යයෙක්, කවච මත්ස්‍යයෙක්, මුතු බෙල්ලෙක් මෘද්වංගියෙක්, හොලෝතූරියාවෙක් හෝ ජලජ ක්ෂීරපායී සත්වයෙක් හෝ එවැනි ජීවීන්ගේ පැටවී, බිත්තර හෝ අණ්ඩපාන සහ ප්ලවාංග ඊට ඇතුළත් වේ;

"ධීවර බෝට්ටුව" යන්නෙන්, මසුන් ඇල්ලීම සඳහා තත්කාලයේ යොදවා ඇති කවර වූවද යාත්‍රාවක් අදහස් වන අතර, එහි පැදවුම් ඒකකය සහ ධීවර ආම්පන්න සහ වෙනත් උපකරණ ඊට ඇතුළත් වේ;

"ධීවර ආරාවුල" යන්නෙන්, මසුන් ඇල්ලීමෙහි නිරතව සිටින තැනැත්තන් හෝ කණ්ඩායම් හෝ දෙකක් නැතහොත් ඊට වැඩි සංඛ්‍යාවක් අතර, ශ්‍රී ලංකා ජල තීරයේ යම් කොටසක මසුන් ඇල්ලීමේ අයිතිය සම්බන්ධයෙන් හෝ මසුන් ඇල්ලීමේ කාලය, ආකාරය හෝ ස්ථානය සම්බන්ධයෙන් උද්ගත වන යම් ආරාවුලක් අදහස් වන අතර, ජලජීවී වගාව සඳහා ජලය හෝ ඉඩම් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් උද්ගත වන ආරාවුලක් ඊට ඇතුළත් වේ;

"ධීවර මෙහෙයුම" යන්නෙන්, කවර වුවද ක්‍රමයකින් මසුන් ඇල්ලීම, ගැනීම, මැරීම, එකතු කිරීම හෝ බෝකිරීම අදහස් වන අතර, මසුන් ඇල්ලීමට, ගැනීමට, මැරීමට, එකතු කිරීමට හෝ බෝකිරීම දරනු ලබන යම් ප්‍රයත්නයක් ඊට ඇතුළත් වේ;

"විදේශීය ධීවර බෝට්ටුව" යන්නෙන්, දේශීය නොවන යම් ධීවර බෝට්ටුවක් අදහස් වේ;

"ආනයනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ සීමාවලින් පිටත හෝ ඉන් ඔබ්බෙන් පිහිටි යම් ස්ථානයකින් මුහුදින් හෝ ගුවනින් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම අදහස් වේ;

"අභ්‍යන්තර ජලාශ" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පිහිටි පොදු ගංගා, විල්, මෝයවල්, කලපු, දොල මාර්ග, වැව්, තටාක, ඇළ මාර්ග සහ වෙනත් කවර වූවද පොදු මිරිදිය හෝ කරදිය ප්‍රදේශ අදහස් වේ;

"දේශීය ධීවර බෝට්ටුව" යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ ශ්‍රී ලංකාවේ යම් නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවකට සම්පූර්ණයෙන්ම අයත් වන; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන තැනැත්තන් එක් අයකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට සම්පූර්ණයෙන් අයත් වන; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ද ඡන්ද බලය හිමි කොටස් අතුරින් බහුතර සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අයත්ව ඇත්තා වූ ද, යම් සමාගමකට, සමිතියකට හෝ තැනැත්තන්ගේ යම් සංගමයකට සම්පූර්ණයෙන්ම අයත් වන ධීවර බෝට්ටුවක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ධීවර සහ ජලජ සම්පත් විෂයය භාරව සිටීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය" යන්නෙන්, 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජ්‍යායතනය අදහස් වේ;

"මුතුබෙලි තීරය" යන්නෙන්, නියෝග මගින් කලින් කල නියම කරනු ලබන ප්‍රදේශය අදහස් වන අතර, එවැනි මුතුබෙලි පරයක පතුල ඊට ඇතුළත් වේ;

"මුතු බෙල්ලා" යන්නෙන්, මුතු සෑදෙන කවර වූවද වර්ගයක බෙල්ලකු අදහස් වන අතර, "වින්ඩෝ පේන් ඔයිස්ටර්" හෝ "තම්පලකම් පර්ල් ඔයිස්ටර්" යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නා වූ ද ප්ලැකුනා ප්ලැසන්ටා යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන්නා වූ ද මාද්දංගියා මෙන්ම ශ්‍රී ලංකාවේ වෙරළ ඔබ්බෙන් හෝ ශ්‍රී ලංකාවේ මුහුදු බොකුවල හෝ අභ්‍යන්තර ජලාශවල ඇති කරන ලබන හෝ තැන්පත් කරනු ලබන මුතු නිපදවන වෙනත් යම් මාද්දංගියෙක් ඊට ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ;

" විකිණීම " යන්න, එහි ව්‍යාකරණ ප්‍රභේද සහ සජාතික පද සමග ගත් කල, සාමාන්‍ය වෙළෙඳ හෝ ව්‍යාපාර කටයුතුවල දී මුදලට හෝ කල් තබනු ලැබූ ගෙවීම මත හෝ වෙනත් වට්නා ප්‍රතිඥාවක් මත මසුන්ගේ සන්තකය එක් තැනැත්තකුගෙන් වෙනත් තැනැත්තකුට මාරු කිරීම ඇත් අදහස් වේ ;

" ශ්‍රී ලංකා ජල තීරය " යන්නෙන්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක් මගින් ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශය ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයක් මගින් ශ්‍රී ලංකාවේ යාබද කලාපය වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශය ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ ජීව සම්පත් කලාපය වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශය ;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජල ප්‍රදේශය වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ ප්‍රදේශය; සහ

(ඉ) සියලුම පොදු මුහුදු බොක්කු, ගංගා, විල්, කලපු, මෝයවල්, දොළ මාර්ග, වැව්, පොකුණු, ඇළ සහ අනෙකුත් සියලුම පොදු, ගොඩබිම් හෝ අභ්‍යන්තර ජල ප්‍රදේශ

අදහස් වේ.

මේ පනත අදාළ කිරීම.

67. මේ පනතේ විධිවිධාන, (469 වන අධිකාරය වන) වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ කිරීමේ ආඥාපනතේ සහ (451 වන අධිකාරය වන) කැලෑ ආඥාපනතේ විධිවිධාන හෝ ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් ඇල්ලීමට හෝ මසුන් ඇල්ලීමේ ක්‍රමවලට අදාළව එකී ආඥාපනත් යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ රීතියක් බලගින්න වන ආකාරයෙන් නොව, ඒවාට අමතරව, අදාළ කරනු ලැබිය යුතු ය.